අ.පො.ස (උ.පෙළ) විභාගය - 2013

ඇගයීම් වාර්තාව

33 - ගිණුම්කරණය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2013

ඇගයීම් වාර්තාව

33 - ගිණුම්කරණය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

ගිණුම්කරණය

ඇගයීම් වාර්තාව - අ.පොෂ.ස.(උ.පෙළ) විභාගය - 2013

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස
පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ
ව්‍යාපෘතිය (TSEP-WB) මගින්

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පොෂ.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2013 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 209 906ක් පාසල් අයදුම්කරුවෝ ද 31 723ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පොෂ.(උ.පෙළ) ගිණුම්කරණය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ගිණුම්කරණය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පොෂ.(උ.පෙළ) 2012 විභාගයේ ගිණුම්කරණය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2015 ජනවාරි 19
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපදේශකත්වය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	නිමාලි හේරත් සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) ආචාර්ය ඩබ්.වී.ඒ.ඩී. කරුණාරත්න ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණකාධිකරණ අධ්‍යයන අංශය කැලණිය විශ්ව විද්‍යාලය ආචාර්ය හරේන්ද්‍ර කාරියවසම් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණකාධිකරණ අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය රංගජීව හේරත් කථිකාචාර්ය, ගණකාධිකරණ අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්ලිව්.ඇම්. ප්‍රේමණී ප්‍රනාන්දු සාන්ත පීතර විදුහල බම්බලපිටිය. එන්.එම්. නිමල් කරුණාතිලක හලා/ආනන්ද ජාතික පාසල හලාවත. අයි.ඩී. ප්‍රේමතිලක ගා/කරන්දෙණිය මධ්‍ය විද්‍යාලය කරන්දෙණිය.
පරිගණක පිටපත සැකසුම	:	කේ.ඒ. ඉරෝෂා බණ්ඩාර පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවරය සැකසුම	:	වයි.එස්. අනුරාධි සංවර්ධන නිලධාරි

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1 **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 **විෂය අභිමතාර්ථ** 1

1.2 **විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු**

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 **විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2 **ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 8
2.1.2. I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 30 තෙක් ප්‍රශ්න 9
2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14
2.1.4. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15
2.1.5. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21
2.1.6. I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය ප්‍රතිශත ලෙස 22
2.1.7. I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය ප්‍රතිශත ලෙස 25

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 27
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, නිරීක්ෂණ, නිගමන හා යෝජනා 28
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 63

III කොටස

3 **පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 64
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 65

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ගිණුම්කරණය විෂයයෙහි අභිමතාර්ථ

මෙම විෂය හැදෑරීමෙන් ශිෂ්‍යයා,

* ගිණුම්කරණ සංකල්පීය රාමුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.
* ගිණුම්කරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ලබාගත් මූලික දැනුම භාවිතයට ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් විවෘතව ඇති නව්‍යතා අවබෝධ කර ගනියි.
* ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රය තුළින් ලබාගන්නා වූ දැනුම විවිධ වෘත්තීය අවශ්‍යතා සඳහා භාවිතයට ගනියි.
* සමාජ ආර්ථික පරිසරයකට ඵලදායි ලෙස කටයුතු කළ හැකි කළමනාකරණ කුසලතා ලබා ගනියි.
* විවිධ ව්‍යාපාර සංවිධානවල ගිණුම් තැබීම පිළිබඳ කුසලතා ලබා ගනියි.
* විෂය ක්ෂේත්‍රය තුළ ගවේෂණය තුළින් ලැබෙන හුරුව අනාගත පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට දායක කර ගනියි.
* සම්පත් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා වර්ධනය කර ගනියි.

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	51182	3680	54862
දෙමළ	8147	559	8706
ඉංග්‍රීසි	1742	498	2240
එකතුව	**61071**	**4737**	**65808**

වගුව 1

1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	6411	10.50	303	6.40	6714	10.20
B	5292	8.67	302	6.38	5594	8.50
C	12575	20.59	778	16.42	13353	20.29
S	15387	25.20	1082	22.84	16469	25.03
F	21406	35.05	2272	47.96	23678	35.98
එකතුව	**61071**	**100.00**	**4737**	**100.00**	**65808**	**100.00**

වගුව 2

විභාගයට පෙනී සිටි පාසල් අයදුම්කරුවන්ගෙන් 65%ක් පමණ ගිණුම්කරණය විෂය සමත් වුවද පෞද්ගලික අයදුම්කරුවන්ගෙන් මෙම විෂය සමත්ව ඇත්තේ 52%ක් පමණක් බව ඉහත සංඛ්‍යාලේඛන අනුව පැහැදිලි වේ.

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සිසුන් ගණන	%	සිසුන් ගණන	%	සිසුන් ගණන	%	සිසුන් ගණන	%	සිසුන් ගණන	%	සිසුන් ගණන	%
1. කොළඹ	9382	1296	13.81	863	9.20	2011	21.43	2417	25.76	6587	70.21	2795	29.79
2. ගම්පහ	6056	616	10.17	458	7.56	1080	17.83	1467	24.22	3621	59.79	2435	40.21
3. කළුතර	3004	334	11.12	274	9.12	588	19.57	712	23.70	1908	63.52	1096	36.48
4. මහනුවර	3512	274	7.80	235	6.69	666	18.96	961	27.36	2136	60.82	1376	39.18
5. මාතලේ	1013	48	4.74	61	6.02	133	13.13	240	23.69	482	47.58	531	52.42
6. නුවරඑළිය	1427	92	6.45	89	6.24	243	17.03	356	24.95	780	54.66	647	45.34
7. ගාල්ල	2952	433	14.67	279	9.45	566	19.17	600	20.33	1878	63.62	1074	36.38
8. මාතර	2134	226	10.59	184	8.62	494	23.15	540	25.30	1444	67.67	690	32.33
9. හම්බන්තොට	1236	87	7.04	91	7.36	196	15.86	309	25.00	683	55.26	553	44.74
10. යාපනය	1096	95	8.67	79	7.21	251	22.90	308	28.10	733	66.88	363	33.12
11. කිලිනොච්චි	212	9	4.25	17	8.02	48	22.64	73	34.43	147	69.34	65	30.66
12. මන්නාරම	207	14	6.76	12	5.80	36	17.39	56	27.05	118	57.00	89	43.00
13. වව්නියාව	297	37	12.46	25	8.42	67	22.56	67	22.56	196	65.99	101	34.01
14. මුලතිව්	192	8	4.17	16	8.33	37	19.27	52	27.08	113	58.85	79	41.15
15. මඩකලපුව	784	111	14.16	90	11.48	195	24.87	206	26.28	602	76.72	182	23.21
16. අම්පාර	1261	88	6.98	105	8.33	259	20.54	339	26.88	791	62.73	470	37.27
17. ත්‍රිකුණාමලය	663	50	7.54	44	6.64	110	16.59	171	25.79	375	56.56	288	43.44
18. කුරුණෑගල	3258	219	6.72	198	6.08	543	16.67	759	23.30	1719	52.76	1539	47.24
19. පුත්තලම	1484	133	8.96	120	8.09	307	20.69	379	25.54	939	63.27	545	36.73
20. අනුරාධපුරය	1679	97	5.78	102	6.08	273	16.26	450	26.80	922	54.91	757	45.09
21. පොළොන්නරුව	825	37	4.48	38	4.61	155	18.79	184	22.30	414	50.18	411	49.82
22. බදුල්ල	1874	131	6.99	110	5.87	324	17.29	459	24.49	1024	54.64	850	45.36
23. මොනරාගල	939	65	6.92	56	5.96	167	17.78	241	25.67	529	56.34	410	43.66
24. රත්නපුරය	2538	297	11.70	224	8.83	505	19.90	611	24.07	1637	64.50	901	35.50
25. කෑගල්ල	1696	119	7.02	125	7.37	325	19.16	421	24.82	990	58.37	706	41.63
සමස්ත දිවයින	**49721**	**4916**	**9.89**	**3895**	**7.83**	**9579**	**19.27**	**12378**	**24.89**	**30768**	**61.88**	**18953**	**38.12**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	421	0.64	65808	100.00
81 - 90	2845	4.32	65387	99.36
71 - 80	4882	7.42	62542	95.04
61 - 70	6175	9.38	57660	87.62
51 - 60	7796	11.85	51485	78.24
41 - 50	9855	14.98	43689	66.39
31 - 40	11405	17.33	33834	51.41
21 - 30	11221	17.05	22429	34.08
11 - 20	9185	13.96	11208	17.03
01 - 10	2014	3.06	2023	3.07
00 - 00	9	0.01	9	0.01

වගුව 4

මෙම විෂය සඳහා අපේක්ෂකයින් ලකුණු ලබාගත් ආකාරය පන්ති ප්‍රාන්තර අනුව ඉහත වගුවේ දැක්වේ. උදාහරණ වශයෙන් ගතහොත් ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 65808 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 11405 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 17.33%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 33834ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 51.41%කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



පුස්තාරය 1 (RD/16/05/AL) පෝරමයෙන් ලබාගත් නොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)
උදා: ඉහත පුස්තාරය අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 47 වන ප්‍රශ්නයයි. එහි ප්‍රතිශතය 88%කි.
අඩුම සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත්තේ 49 වන ප්‍රශ්නයයි. එහි ප්‍රතිශතය 6%කි.

1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරය අනුව පැහැදිලි වන්නේ 1 සහ 2 ප්‍රශ්න අනිවාර්ය වුවත් සුළු පිරිසක් පිළිතුරු සපයා නොමැති බවයි. අයදුම්කරුවන්ගෙන් වැඩිම පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ II පත්‍රයේ 3 වන ප්‍රශ්නයටයි. එය 91%ක් පමණ වේ. තෝරා ගන්නා ප්‍රශ්න අතුරින් (3-7) අඩුවෙන්ම තෝරාගෙන ඇත්තේ 4 වන ප්‍රශ්නය වන අතර එය 61%කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින් 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු (16-20) තෙක් ලබාගත් ප්‍රතිශතය 15%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයේ එනම් ලකුණු (0-5) තෙක් ලබාගත් ප්‍රතිශතය 36%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4. **II** ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාර 4 (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

II කොටස

2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

* කාලය පැය 02 යි.
* බහුවරණ ප්‍රශ්න 30ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කි.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.
* පිළිතුරු පත් ඇගයීමේදී සෑම ප්‍රශ්නයකට ම ලකුණු 4 බැගින් ලබා දෙනු ඇත. ඒ අනුව මුළු ලකුණු 200 කි.
* අවසාන ලකුණු ගණනය කරන ආකාරය පිළිබඳව 25 පිටුවේ ඇතුළත් වේ.

2.1.2 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න

1. පහත දක්වෙන කුමන ප්‍රකාශයෙන් ආයතනයක මූල්‍ය ගණකාධිකරණයේ කාර්යභාරය **වඩාත්** හොඳින් විස්තර කරනු ලබයි ද?
   (1) එය ආයතනයක ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කරයි.
   (2) එය ආයතනයක ගනුදෙනු මූල්‍ය තොරතුරුවලට පරිවර්තනය කරයි.
   (3) එය ආයතනයක වාර්ෂික විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.
   (4) එය ආයතනයක සැලසුම් කිරීම සහ පාලනය සඳහා කළමනාකරුවන්ට තොරතුරු සපයයි.
   (5) එය ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන බාහිර පාර්ශ්වයන්ට සහ එහි කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි. (.....)

2. ගිණුම්කරණ සම්කරණයේ මූලිකාංගයක් ලෙස හිමිකම වෙන ම හඳුනාගැනීම අවශ්‍ය වන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අනුව ද?
   (1) ඒකක (2) උපචිත (3) අඛණ්ඩ පැවැත්ම
   (4) ගැලපුම් (5) කාලවිච්ඡේද (.....)

3. ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල වගකීම් සහතික මත ප්‍රතිපාදනයක් කිරීමට අදළ වන්නේ පහත සඳහන් කුමන ගිණුම්කරණ සංකල්පය / සංකල්ප ද?
   A - උපචිත B - ගැලපුම් C - ආරක්ෂණ
   (1) B පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
   (4) B හා C පමණි (5) A, B හා C යන සියල්ල ම (.....)

4. 2012.04.01 දින අමල් ඔහුගේ පෞද්ගලික ඉතුරුම් රු. 500 000 ක් සහ ඔහුගේ රු. 2 000 000 ක් වටිනා මෝටර් රථය යොදවමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පළමු මෙහෙයුම් මාසය තුළ දී ව්‍යාපාරය රු. 300 000 ක භාණ්ඩ ණයට මිල දී ගත් අතර එයින් රු. 50 000 ක් වටිනා භාණ්ඩ දෝෂ සහිත වීම නිසා ආපසු යවන ලදී. මෙම ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිලිවල අනුපිළිවෙළ වන්නේ:
   (1) ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, හරපත.
   (2) ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, බැරපත.
   (3) ලදුපත, ඉන්වොයිසිය, බැරපත.
   (4) වාහන ලියාපදිංචි පොත, ඉන්වොයිසිය, බැරපත.
   (5) වාහන ලියාපදිංචි පොත, ඉන්වොයිසිය, හරපත. (.....)

5. ව්‍යාපාර ආයතනයක් විසින් 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ලකුණු කළ මිල රු. 200 000 ක් වූ භාණ්ඩ ණය පදනම මත මිල දී ගන්නා ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සම්කරණයේ නිරූපණය කරනුයේ:

	වත්කම්	වගකීම්	හිමිකම්
(1)	රු. 180 000 කින් වැඩි වේ.	රු. 180 000 කින් වැඩි වේ.	-
(2)	රු. 200 000 කින් වැඩි වේ.	රු. 200 000 කින් වැඩි වේ.	-
(3)	රු. 180 000 කින් වැඩි වේ.	රු. 200 000 කින් වැඩි වේ.	රු. 20 000 කින් අඩු වේ.
(4)	රු. 200 000 කින් වැඩි වේ.	රු. 180 000 කින් වැඩි වේ.	රු. 20 000 කින් වැඩි වේ.
(5)	රු. 200 000 කින් වැඩි වේ.	රු. 220 000 කින් වැඩි වේ.	රු. 20 000 කින් අඩු වේ. (.....)

6. පහත තොරතුරු 2013 මාර්තු මාසය සඳහා ව්‍යාපාරයකට අදළ වේ.

විකුණුම්	ලකුණු කළ මිල (රු.'000)	වෙළෙඳ වට්ටම්
මුදලට	1 000	10%
ණයට	4 000	5%

විකුණුම් දින සිට දින 15 ක් තුළ ගෙවිය යුතු මුදල පියවූ විට ණයගැතියන්ට 5% ක මුදල් වට්ටමක් දෙනු ලැබේ. ව්‍යාපාරයෙ වාර්තාවලට අනුව ණයගැති ශේෂවලින් 50% ක් මෙම වට්ටම භාවිත කරමින් පියවා ඇත.
ණයගැතියන්ට දුන් වට්ටම් සටහන් කිරීම සඳහා නිවැරදි ජර්නල් සටහන වනුයේ:

	හර (රු.)		බැර (රු.)	
(1)	දුන් වට්ටම් ගිණුම	95 000	මුදල් ගිණුම	95 000
(2)	දුන් වට්ටම් ගිණුම	95 000	ණයගැති පාලන ගිණුම	95 000
(3)	දුන් වට්ටම් ගිණුම	195 000	මුදල් ගිණුම	195 000
(4)	දුන් වට්ටම් ගිණුම	295 000	ණයගැති පාලන ගිණුම	295 000
(5)	දුන් වට්ටම් ගිණුම	395 000	මුදල් ගිණුම	395 000 (.....)

7. පහත සඳහන් කුමන ප්‍රකාශය ණයහිමි පාලන ගිණුමට අදළව **නිවැරදි** වේ ද?
   (1) සෑම ණයහිමියෙක් වෙනුවෙන් ම පාලන ගිණුමක් පවත්වාගෙන යයි.
   (2) සියලු ම ගැනුම් ණයහිමි පාලන ගිණුමේ සටහන් කරයි.
   (3) ගැනුම් ජර්නලයේ එකතුව ණයහිමි පාලන ගිණුමේ සටහන් කරයි.
   (4) ණයහිමියන්ගෙන් ලද වට්ටම් ණයහිමි පාලන ගිණුමේ සටහන් නොකරයි.
   (5) ණයහිමි පාලන ගිණුම ණයහිමි ලෙජරයේ පවත්වාගෙන යයි. (.....)

● **ප්‍රශ්න අංක 8 සහ 9 ට පිළිතුරු සැපයීමට ආයතනයකට අදළ පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

2013 මාර්තු සහ පෙබරවාරි මාස තුළ දී තැන්පත් කළ චෙක්පත් හා නිකුත් කළ චෙක්පත්වල සාරාංශය පහත පරිදි වේ.

විස්තරය	2013 මාර්තු (රු. '000)	2013 පෙබරවාරි (රු. '000)
බැංකුවේ තැන්පත් කළ චෙක්පත්	1000	900
චෙක්පත් නිකුත් කිරීම්	750	600

පහත තොරතුරු ද දී ඇත:

විස්තරය	2013.03.31 දිනට (රු. '000)	2013.02.28 දිනට (රු. '000)
චෙක්පත් තැන්පතු උපලබ්ධි වීම	750	900
ගෙවීම සඳහා ඉදිරිපත් කළ චෙක්පත්	600	500
බැංකුවට සෘජුව ලද පොලී ආදායම	-	50
බැංකු ගාස්තු	10	5
බැංකු ගිණුමේ ශේෂය (පොලී ආදායම හා බැංකු ගාස්තු ගැලපීමට පෙර)	395	100
බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය	?	245

පෙබරවාරි මාසය තුළ දී ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් මාර්තු මාසයේ දී ගෙවීමට ඉදිරිපත් කර ඇත.

8. 2013.02.28 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය කොපමණ ද?
(1) රු. 145000 (2) රු. 190000 (3) රු. 200000 (4) රු. 290000 (5) රු. 345000 (.....)

9. 2013.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය කොපමණ ද?
(1) රු. 245000 (2) රු. 285000 (3) රු. 295000 (4) රු. 385000 (5) රු. 395000 (.....)

10. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව පහත සඳහන් කුමන දෑ මූල්‍ය ප්‍රකාශනවල **මූලික** ගුණාත්මක ගතිලක්ෂණ ලෙස සලකනු ලබයි ද?
A - අදළ බව B - තේරුම්ගත හැකි බව C - විවක්ෂණශීලී බව D - ප්‍රමාණාත්මක බව
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.
(4) B හා C පමණි. (5) A, B, C හා D යන සියල්ල ම. (.....)

11. පහත සඳහන් තොරතුරු 2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සමාගමකට අදළ වේ.

විස්තරය	ඒකක	ඒකකයක මිල (රු.)
2013.03.01 දිනට තොගය	1000	100
2013.03.07 දින ගැනුම්	5000	120
2013.03.15 දින ගැනුම්	3000	140
2013.03.20 දින විකුණුම්	8000	-

තොග නිකුත් කිරීම, මිල කිරීම සඳහා සමාගම 'පෙර-ඇතුළු පෙර-පිට' ක්‍රමය භාවිත කරයි. වර්ෂය අවසාන තොගයේ ඒකකයක ශුද්ධ උපලබ්ධි අගය රු. 120 කි. සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කළ යුතු 2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය සහ 2013.03.31 දිනට තොගයේ අගය කොපමණ ද?

	2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය (රු.)	2013.03.31 දිනට තොගය (රු.)
(1)	960000	120000
(2)	980000	140000
(3)	980000	120000
(4)	1020000	100000
(5)	1020000	120000

(.....)

12. සමාගමක් විසින් 2012.10.01 දින අවත්හලක් ඉදි කිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගන්නා ලදී. මීට අදළව පහත පිරිවැය දරන ලදී.

	රු.'000
ඉඩමේ ගැනුම් මිල	4000
මුද්දර ගාස්තු සහ නීති ගාස්තු	200
ඉඩමේ පිහිටි පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීමේ පිරිවැය	200
ඉදිකිරීම් සඳහා ඉඩම සකස් කිරීමේ පිරිවැය	250
ඉඩමේ වාර්ෂික නඩත්තු පිරිවැය	100

තව ද, පැරණි ගොඩනැගිල්ලෙහි ඉවත් කරන ලද ද්‍රව්‍ය රු. 50000 කට විකුණන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට (දේපළ, පිරියත සහ උපකරණ) අනුව 2013.03.31 දිනට ඉඩමේ පිරිවැය කොපමණ ද?
(1) රු. 4400000 (2) රු. 4450000 (3) රු. 4550000 (4) රු. 4600000 (5) රු. 4700000 (.....)

13. පහත දී ඇති තොරතුරු 2013 මාර්තු මාසය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයකට අදළ වේ.

	රු.'000
නොනිමි තොග වැඩි වීම (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද)	300
නිමි තොග අඩු වීම	100
පරිභෝජනය කළ සෘජු අමුද්‍රව්‍ය	300
සෘජු ශ්‍රමය	200
කම්හල් පොදු කාර්යය පිරිවැය	200

2013 මාර්තු මාසය සඳහා ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය සහ විකුණුම් පිරිවැය කොපමණ ද?

	ප්‍රාථමික පිරිවැය (රු.)	විකුණුම් පිරිවැය (රු.)
(1)	200000	300000
(2)	200000	500000
(3)	800000	900000
(4)	800000	1100000
(5)	1000000	900000

(.....)

14. 2013.03.31 දිනට සමාගමක පැවති තොගය ගංවතුර හේතුවෙන් සම්පූර්ණයෙන් ම විනාශ විය. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

	රු.'000
2012.04.01 දිනට තොගය	1500
ගැනුම්	3500
ආපසු යැවුම්	500
විකුණුම්	4800
විකුණුම් වියදම්	600

පිරිවැය මත 20% ක ලාභ අනුපාතිකයක් පවත්වා ගනිමින් භාණ්ඩ විකිණීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

2013.03.31 දිනට විනාශ වූ තොගයේ අගය කොපමණ ද?

(1) රු. 500000 (2) රු. 660000 (3) රු. 750000 (4) රු. 1160000 (5) රු. 1500000 (.....)

15. භවුල්කරුවකු විසින් භවුල් ව්‍යාපාරයට ලබා දෙන ලද ණයක් සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?

A - වෙනත් ආකාරයකට එකඟ වී නොමැති විට වාර්ෂිකව 5% ක පොලියකට භවුල්කරු හිමිකම් ලබයි.
B - ණය මුදල භවුල් ව්‍යාපාරයේ හිමිකමේ කොටසක් ලෙස සලකනු ලබයි.
C - භවුල්කරුවන්ට ලාභඅලාභ විසර්ජනය කිරීමේ දී ණය පොලී ගලපනු ලබයි.

(1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) A, B හා C යන සියල්ල ම (.....)

- **ප්‍රශ්න අංක 16, 17 සහ 18 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

භානුක සහ හේමක පිළිවෙළින් රු. 3000000 ක් සහ රු. 4000000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් භවුල් ව්‍යාපාරයක් 2012.04.01 දින ආරම්භ කරන ලදී. ඔවුන් පහත සඳහන් කොන්දේසිවලට එකඟ විය.

- භානුක සහ හේමක පිළිවෙළින් රු. 450000 ක සහ රු. 750000 ක වාර්ෂික වැටුපකට හිමිකම් ලබයි.
- සෑම භවුල්කරුවකුට ම ප්‍රාග්ධනය මත වාර්ෂිකව 10% ක පොලියක් හිමි වේ.
- භානුක සහ හේමක අතර ලාභඅලාභ සම සමව බෙදා ගනු ලබයි.

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ භවුල් ව්‍යාපාරය රු. 2400000 ක ලාභයක් ලැබීය. භවුල්කරුවන්ට හිමි වැටුප් සහ පොලී වර්ෂය තුළ දී මුදලින් ලබා ගෙන නොමැත.

2013.03.31 දින ශානක භවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. ඔහු විසින් ප්‍රාග්ධනය ලෙස රු. 2000000 ක් ගෙන එන ලදී. මෙදින භවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 800000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාමය වත්කමක් ලෙස පොත්වල සටහන් නොකළ අතර එය භවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගලපන ලදී. භානුක, හේමක සහ ශානක 2013.04.01 දින සිට භවුල් ව්‍යාපාරයේ ලාභඅලාභ 2:2:1 අනුපාතයට බෙදා ගැනීමට එකඟ විය.

16. 2013.03.31 දිනට භානුක සහ හේමකගේ ජංගම ගිණුම්වල ශේෂයන් කොපමණ ද?

	භානුක (රු.)	හේමක (රු.)
(1)	250000	250000
(2)	550000	650000
(3)	700000	1000000
(4)	1000000	1400000
(5)	1200000	1200000

(.....)

17. 2013.03.31 දිනට භවුල් ව්‍යාපාරයේ හිමිකමේ **වැඩි වීම** කොපමණ ද?

(1) රු. 800000 (2) රු. 2000000 (3) රු. 2800000 (4) රු. 3200000 (5) රු. 4400000 (.....)

18. 2013.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් කොපමණ ද?

	භානුක (රු.)	**හේමක (රු.)**	**ගානක (රු.)**
(1)	3 080 000	4 080 000	1 840 000
(2)	3 320 000	4 320 000	2 160 000
(3)	3 380 000	4 480 000	2 040 000
(4)	3 300 000	4 400 000	2 000 000
(5)	3 400 000	4 400 000	2 000 000

(.....)

19. හිමිකම් කොටස් නිකුතුවක දී සියලු ම හිමිකම් දැනට සිටින කොටස්කරුවන් විසින් භාවිත කළේ නම්, සමාගමේ වත්කම් සහ හිමිකම්වල වටිනාකමට ඇතිවන බලපෑම කුමක් ද?

	වත්කම්	**හිමිකම්**
(1)	වැඩි වේ.	වැඩි වේ.
(2)	අඩු වේ.	අඩු වේ.
(3)	අඩු වේ.	වැඩි වේ.
(4)	වැඩි වේ.	අඩු වේ.
(5)	වෙනස් නොවේ.	වෙනස් නොවේ.

(.....)

20. පහත දැක්වෙන කුමන දෑ සමාගමක හිමිකමේ සංරචක ලෙස හඳුනාගනු ලබයි ද?

A - ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය
B - ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්
C - ක්ෂය සඳහා වෙන් කිරීම
D - රඳවාගත් ඉපැයුම්

(1) A හා C පමණි (2) A හා D පමණි (3) B හා D පමණි
(4) C හා D පමණි (5) A, C හා D පමණි

(.....)

21. පහත තොරතුරු 2013.03.31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමකට අදාළ වේ.

	රු. '000
වර්ෂය සඳහා ලාභය	850
ක්ෂය	120
ගොඩනැගිල්ල විකිණීමේ ලාභය	50
තොග වැඩි වීම්	20
ණයගැතියෝ අඩු වීම්	40

වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ වනුයේ:

(1) රු. 760 000 (2) රු. 800 000 (3) රු. 900 000 (4) රු. 920 000 (5) රු. 940 000 (.....)

22. පහත සඳහන් කුමන සිද්ධීන් සමාගමක මූල්‍ය ප්‍රකාශනවල වගකීම් සඳහා ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමට තුඩු දේ ද?

A - දෝෂ සහිත අයිතම අළුත්වැඩියා කිරීමේ වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකිණීම.
B - වර්ෂය අවසානයේ වෙළඳ ණයගැති ශේෂය මත අඩමාන ණය සඳහා වෙන් කිරීම.
C - නෛතික අවශ්‍යතාවක් නොමැති වුවත් නිෂ්පාදන ක්‍රියාවලිය හේතුවෙන් සිදු වූ පාරිසරික හානිය අවම කිරීම අවශ්‍ය වීම.

(1) A පමණි (2) B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) A, B හා C යන සියල්ල ම

(.....)

23. සීමිත නන්දන පොදු සමාගමේ 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂකවරුන් විසින් 2013.05.31 දින අනුමත කරන ලදී. සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2013.06.15 දින පවත්වන ලදී. 2013.03.31 දිනට පසුව සමාගමට අදළව පහත සිද්ධීන් ඇති විය.

A - කොළඹ පුරුකුම්පත් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල, සමාගම විසින් කළ ආයෝජනවල වෙළෙඳපොළ අගය 2013.04.01 දින සිට 2013.04.20 දින දක්වා අඩු වීම
B - 2012.10.01 දින සමාගමට එදිරිව නඩුවක් ගොනු කළ ප්‍රධාන ගනුදෙනුකරුවකු වෙත සමාගම විසින් වන්දි ගෙවිය යුතු යැයි 2013.04.30 දින උසාවිය විසින් තීන්දු කිරීම
C - 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටසකට රු. 2 ක අවසන් ලාභාංශයක් 2013.06.10 දින ප්‍රකාශයට පත් කිරීම
D - 2013.03.31 දිනට පැවති තොගය එහි පිරිවැයට වඩා අඩු මිලකට 2013.05.25 දින විකිණීම

ඉහත කුමන සිද්ධීන් 2013.03.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු ද?

(1) A හා C පමණි (2) A හා D පමණි (3) B හා D පමණි
(4) B, C හා D පමණි (5) A, B, C හා D යන සියල්ල ම

(.....)

24. වෙළඳ ව්‍යාපාරයක යෙදෙන සමාගම්කා ණය අනුපාතය 3:1 ක් වේ. සමාගමේ පහත කුමන ගනුදෙනුව මෙම අනුපාතය **අඩු වීමට** බලපානු ලබයි ද?

(1) දිගු කාලීන ණයක් ලබා ගැනීම (2) ලාභයක් සහිතව තොග ණයට විකිණීම
(3) යන්ත්‍රයක් අත්පිට මුදලට මිල දී ගැනීම (4) ණයගැතියන්ගෙන් මුදල් ලැබීම
(5) ණයහිමියන්ට මුදල් ගෙවීම

(.....)

25. පහත තොරතුරු සමාගමක 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදළ වේ.

	රු.'000
විකුණුම්	900
විකුණුම් පිරිවැය	600
2012.04.01 දිනට තොගය	125
2013.03.31 දිනට තොගය	175

වර්ෂයක් සඳහා වැඩ කරන දින 360 ක් බව උපකල්පනය කරන්න.
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ තොග රැඳවුම් කාලය:
(1) දින 60 (2) දින 70 (3) දින 75 (4) දින 90 (5) දින 105 (.....)

26. ආයතනයක් භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයකට අදළව පහත තොරතුරු දී ඇත.

	උපරිම	අවම
පරිභෝජනය (ඒකක)	600	200
පොරොත්තු කාලය (සති)	6	3

මෙම අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම කොපමණ ද?
(1) ඒකක 600 (2) ඒකක 1 800 (3) ඒකක 3 000 (4) ඒකක 3600 (5) ඒකක 4 400 (.....)

27. සමාගමක් විසින් නිපදවන භාණ්ඩයකට අදළව පහත තොරතුරු සපයා ඇත.

ප්‍රාථමික පිරිවැය	රු. 600000
අයවැයගත පොදු කාර්ය පිරිවැය - නිෂ්පාදන දෙපාර්තමේන්තුව	රු. 350000
- සේවා දෙපාර්තමේන්තුව	රු. 50000
නිෂ්පාදන ඒකක සංඛ්‍යාව	ඒකක 75000
අයවැයගත යන්ත්‍ර පැය	50000 (ඒකකයකට යන්ත්‍ර පැය = 5)

යන්ත්‍ර පැයකට පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය සහ ඒකකයක නිෂ්පාදන පිරිවැය වන්නේ:

	යන්ත්‍ර පැයකට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය (රු.)	ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.)
(1)	6	38
(2)	7	43
(3)	7	15
(4)	8	16
(5)	8	48

(.....)

- **ප්‍රශ්න අංක 28 සහ 29 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් 2013.04.01 දින නනි භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලද අතර එම භාණ්ඩ ඒකකයක් රු. 200 බැගින් විකුණනු ලබයි. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දරණ ලද පිරිවැය පහත පරිදි වේ.

ඒකකයක විචල්‍ය පිරිවැය:

සෘජු ද්‍රව්‍ය	රු. 40
සෘජු ශ්‍රමය	රු. 25
නිෂ්පාදන පොදු කාර්යය	රු. 20
විකුණුම් හා බෙදහැරීමේ පොදු කාර්යය	රු. 15

වාර්ෂික ස්ථාවර පිරිවැය:

නිෂ්පාදන පොදු කාර්යය	රු. 200000
විකුණුම් හා බෙදහැරීමේ පොදු කාර්යය	රු. 350000
නිෂ්පාදනය	ඒකක 20000

28. ඒකකයක ප්‍රාථමික පිරිවැය සහ ඒකක 20000 දී මුළු නිෂ්පාදන පිරිවැය පිළිවෙළින්:
(1) රු. 65 සහ රු. 1500000 (2) රු. 65 සහ රු. 1900000 (3) රු. 85 සහ රු. 1900000
(4) රු. 85 සහ රු. 2200000 (5) රු. 100 සහ රු. 2200000 (.....)

29. ඒකකයක දයකය සහ ඒකක 20000 දී ලාභය පිළිවෙළින්:
(1) රු. 90 සහ රු. 1250000 (2) රු. 100 සහ රු. 1450000 (3) රු. 115 සහ රු. 1750000
(4) රු. 125 සහ රු. 1950000 (5) රු. 135 සහ රු. 2150000 (.....)

30. අනෙකුත් සාධක ස්ථාවරව පවතිද්දී විකුණුම් මිලෙහි අඩු වීමක් සහ ස්ථාවර පිරිවැයෙහි වැඩිවීමක් සිදුවන විට පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - සමච්ඡේද ලක්ෂ්‍යයෙහි වෙනසක් සිදු නොවේ. B - සමච්ඡේද ලක්ෂ්‍යය අඩු වේ.
C - සමච්ඡේද ලක්ෂ්‍යය වැඩි වේ. D - ලාභය අඩු වේ.
E - දයකය අඩු වේ.
(1) A හා B පමණි (2) A, B හා E පමණි (3) A, B, C හා D පමණි
(4) C හා D පමණි (5) C, D හා E පමණි (.....)

2.1.3. I ප්‍රශ්න පත්‍රයේ අංක 01 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	5	16.	4
02.	1	17.	5
03.	5	18.	1
04.	1	19.	1
05.	1	20.	2
06.	2	21.	5
07.	3	22.	3
08.	1	23.	3
09.	4	24.	3
10.	1	25.	4
11.	3	26.	2
12.	4	27.	5
13.	2	28.	2
14.	1	29.	2
15.	1	30.	5

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **04** බැගින් මුළු ලකුණු **120**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු හිත් ඉර මත ලියන්න.**

31. අදළ තීරුවේ ලකුණක් යොදමින් පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

ප්‍රකාශය	සත්‍ය	අසත්‍ය
A - කළමනාකරණ ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන අභ්‍යන්තර පාර්ශ්වයන්ට ආයතනයක් පිළිබඳ තීරණ ගැනීමට තොරතුරු සැපයීමයි.	.....	.....
B - ආයතනයක මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් ගිණුම් පොත්වල සටහන් කෙරේ.	.....	.....
C - ආයතනයක තොරතුරු භාවිත කරන බාහිර පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සපයනු ලැබේ.	.....	.....
D - ආර්ථික තීරණ ගැනීමේ සමාජයීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් ගිණුම්කරණය විකාශනය වී ඇත.	.....	.....

පිළිතුර

31. A - සත්‍ය (01)
B - සත්‍ය (01)
C - අසත්‍ය (01)
D - අසත්‍ය (01)

32. ව්‍යාපාරයක සිදු වූ පහත ගනුදෙනු සහ සිද්ධි ගිණුම් වර්ෂ අවසානයේ එහි වත්කම්, වගකීම්, සහ හිමිකම් ශේෂය **වැඩිවීමට, අඩුවීමට** හෝ **වෙනස් නොවීමට** හේතු වන්නේ දැයි සඳහන් කරන්න.

ගනුදෙනුව	වත්කම්	වගකීම්	හිමිකම්
A - අයිතිකරුවන්ගෙන් ප්‍රාග්ධනය ලබා ගැනීම	.....	.....	.....
B - අඩමාන ණය සඳහා වෙන් කිරීම	.....	.....	.....
C - පොලිය සහිතව ණය වාරිකයක් ගෙවීම	.....	.....	.....
D - වර්ෂය අවසානයේ දී සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම	.....	.....	.....

පිළිතුර

32.	වත්කම්	වගකීම්	හිමිකම්
A	වැඩිවේ	වෙනස් නොවේ	වැඩිවේ (01)
B	අඩුවේ	වෙනස් නොවේ	අඩුවේ (01)
C	අඩුවේ	අඩුවේ	අඩුවේ (01)
D	වෙනස් නොවේ	වෙනස් නොවේ	වෙනස් නොවේ (01)

33. පහත එක් එක් ගනුදෙනුව වාර්තා කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිල්ල සහ අදළ මූලික සටහන් පොත සඳහන් කරන්න.

ගනුදෙනුව	මූලාශ්‍ර ලියවිල්ල	මූලික සටහන් පොත
A - තොග ණයට විකිණීම	.....	.....
B - ණයගැතියකු විසින් භාණ්ඩ ආපසු එවීම	.....	.....
C - ණයගැතියන්ගෙන් මුදල් ලැබීම	.....	.....
D - බොල්ණය කපා හැරීම	.....	.....

පිළිතුර

33.	මූලාශ්‍ර ලියවිල්ල		මූලික සටහන් පොත
A	ඉන්වොයිසිය	-	දෛනික විකුණුම් පොත / විකුණුම් ජ'නලය
B	බැරපත	-	ආපසු එවුම් පොත
C	ලදුපත	-	මුදල් පොත/ලැබීම් ජ'නලය
D	ජ'නල් වවුචරය	-	පොදු ජ'නලය (04)

34. මාසයක ආරම්භයේ දී ව්‍යාපාරයේ සුළු මුදල් භාරකරුට, සුළු මුදල් අග්‍රිමය ලෙස රු. 10000 ක් ලබා දී ඇත. මාසය අවසානයේ දී ඔහු රු. 8000 ක් ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

පහත දැ සඳහන් කරන්න.

(අ) මාසයේ සුළු මුදල් වියදම් (රු.) : .....

(ආ) ප්‍රතිපූර්ණය සටහන් කිරීමට ජර්නල් සටහන *(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)* :

.....

.....

පිළිතුර

34. (අ) රු 8 000 (02)

(ආ) සුළු මුදල් පොත හර රු 8 000

මුදල් පොත රු 8 000 (02)

35. 2013.03.01 දින ව්‍යාපාරයක ණයගැති පාලන ගිණුමේ හර ශේෂය රු. 50000 ක් විය. 2013 මාර්තු මාසයේ විකුණුම් ජර්නලයෙ එකතුව වූ රු. 520000, ණයගැති පාලන ගිණුමේ රු. 250000 ක් ලෙස සටහන් කර ඇත. කෙසේ නමුත් විකුණුම් ගිණුමේ නිවැරදි අගය සටහන් කර ඇත. මාසය තුළ දී ණයගැතියන් රු. 200000 ක් ගෙවා ඇත. මාසය අවසාන ණයගැති ශේෂය මත අඩමාන ණය සඳහා 10% ක් වෙන් කර ඇත. ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් ලියා දක්වන්න. *(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)*

.....

.....

.....

.....

පිළිතුර

35. 1. ණයගැති පාලන ගිණුම හර රු 270 000

අවිනිශ්චිත ගිණුම රු 270 000 (02)

2. ලාභාලාභ ගිණුම/අඩමාන ණය ගිණුම හර රු 27 000

අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම රු 27 000 (02)

36. ආයතනයක් විසින් වත්කම් සම්බන්ධයෙන් ගිණුම් තැබීමේදී ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැරව ක්‍රියා කළ හැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

.....

.....

පිළිතුර

36. 1. වත්කම් ප්‍රත්‍යාගණනයට භාජනය වූ විට (02)

2. තොගය ශුද්ධ උපලබ්ධි අගයට ලියා හරින විට (02)

37. ඇගළුම් කර්මාන්තශාලාවක පහත එක් එක් අවස්ථාවට **වඩාත්** අදළ වන ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

A - රෙදි තොගය ජංගම වත්කම් ලෙසත් මහන මැෂින් ජංගම නොවන වත්කම් ලෙසත් වර්ග කිරීම

B - වර්ෂය තුළ දී ගෙවූ කර්මාන්ත ශාලා කුලියෙන් කොටසක් ඉදිරියට කළ ගෙවීමක් ලෙස හඳුනා ගැනීම

C - වර්ෂය අවසාන රෙදි තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට අගය කිරීම

D - ඇගළුම් විකුණන අවස්ථාවේ දී විකුණුම් ආදායම හඳුනා ගැනීම

අයිතමය	**ගිණුම්කරණ සංකල්පය**
A -	.....
B -	.....
C -	.....
D -	.....

පිළිතුර

37. A - අඛණ්ඩ පැවැත්ම (01)
    B - උපචිත/ගැලපුම් (01)
    C - ආරක්ෂණ/විචක්ෂණ (01)
    D - උපලබ්ධි (01)

38. **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව වගකීමක තිබිය යුතු මූලික ලක්ෂණ තුන සඳහන් කරන්න.**

.....

.....

.....

පිළිතුර

38. 1. අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් වීම
    2. වර්තමානයේ ව්‍යාපාරයට බැඳීමක් පැවතීම
    3. පියවීමේදී ව්‍යාපාරයෙන් සම්පත් පිටතට ගලායෑමේ භව්‍යතාවයක් තිබීම (04)

39. 2013.03.31 දිනට එක්සත් ක්‍රීඩා සමාජයේ සාමාජිකයෝ 50 ක් වූහ. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1000 කි. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී, සාමාජික මුදල් ලෙස රු. 45000 ක් මුදලින් ලැබුණි. 2013.03.31 සහ 2012.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් පිළිවෙළින් රු. 5 000 ක් සහ රු. 3 000 ක් විය.
පහත දෑ ගණනය කරන්න:

(අ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම (රු.) .....

(ආ) 2013.03.31 දිනට හිඟහිටි සාමාජික මුදල (රු.) .....

පිළිතුර

39. (අ) රු 50 000 (02)
    (ආ) රු 7 000 (02)

- **ප්‍රශ්න අංක 40 සහ 41 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

බිනූ සහ ධනූ හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම් ශේෂයන් පහත පරිදි වේ.

	2013.03.31 දිනට (රු. '000)	2012.03.31 දිනට (රු. '000)
බිනූ	960	500
ධනූ	940	600

හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- බිනූ සහ ධනූ පිළිවෙළින් රු. 240000 ක සහ රු. 360000 ක වාර්ෂික වේතනයකට හිමිකම් ලබයි.
- බිනූ සහ ධනූ අතර පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභඅලාභ බෙදා ගනු ලැබේ.

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බිනූට සහ ධනූට පිළිවෙළින් රු. 200000 ක සහ රු. 300000 ක වේතන ගෙවා ඇත.

40. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය ඉපැයූ ලාභය කොපමණ ද?

.....

පිළිතුර

40. රු 1 300 000 (04)

41. ඔවුන්ට හිමි වේතන ගෙවා නොමැති නම්, 2013.03.31 දිනට බිනූ සහ ධනූගේ ජංගම ගිණුම් ශේෂ කොපමණ ද?

බිනූ (රු.) ..... ධනූ (රු.) .....

පිළිතුර

41. බිනූ රු 1 160 000/= (02) ධනූ රු 1 240 000 (02)

42. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ට (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් සහ වැරදි) අනුව ආයතනයකට එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා **දෙක** සඳහන් කරන්න.

.....

.....

පිළිතුර

42. 1. ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් ඉල්ලා ඇති විට (02)
    2. වඩාත් විශ්වාසදායි සහ අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමක් සඳහා (02)

- **ප්‍රශ්න අංක 43 සහ 44 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක් විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ පහත කොන්දේසි මත යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී:

- කල්බදු කාලය වසර 3 කි.
- රු. 250000 ක වාර්ෂික කල්බදු වාරිකයක් වසර අග ගෙවිය යුතුය.
- කල්බදු ගිවිසුමේ ගම්‍ය පොළී අනුපාතය 10% කි.
- අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු. 621725 කි.

43. කල්බදු ගිවිසුම ආරම්භයේ දී කල්බදු ගැනුම්කරුගේ පොත්වල කල්බදු වගකීම හඳුනාගැනීම සඳහා ජර්නල් සටහන ලියා දක්වන්න. *(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)*

.....

.....

පිළිතුර

43. යන්ත්‍ර ගිණුම හර රු 621 725

කල්බදු ණය හිමියාගේ ගිණුම රු 621 725 (04)

44. කල්බදු ගැනුම්කරුගේ පොත්වල පහත දැ ගණනය කරන්න.

(අ) පළමු වසර සඳහා කල්බදු පොලිය (රු.) : .....

(ආ) පළමු වර්ෂය අවසානයේ දී කල්බදු වගකීම (රු.) : .....

පිළිතුර

44. (අ) රු 62 173 (02)
(ආ) රු 433 898 (02)

45. 2013.03.31 දිනට සමාගමක ජංගම අනුපාතය 2.5 : 1 ක් වූ අතර එහි ජංගම වගකීම් රු. 120000 ක් විය. මෙදිනට සමාගම සතුව රු. 180000 ක් වටිනා තොග තිබුණි.

(අ) 2013.03.31 දිනට ජංගම වත්කම්වල වටිනාකම කොපමණ ද?.....

(ආ) 2013.03.31 දිනට ක්ෂණික අනුපාතය කොපමණ ද? .....

පිළිතුර

45. (අ) රු 300 000 (02)
(ආ) 1 : 1 (02)

46. පහත එක් එක් අවස්ථාවේ සමාගමක ණය - හිමිකම් අනුපාතය **වැඩි වේ** ද, **අඩු වේ** ද, **වෙනස් නොවේ** ද යන්න සඳහන් කරන්න.

අවස්ථාව	**ණය - හිමිකම් අනුපාතය මත බලපෑම**
A - වත්කම් ඉහළ අගයකට ප්‍රත්‍යාගණනය කිරීම	.....
B - දිගු කාලීන ණයක් ලබා ගැනීම	.....
C - ණයට භාණ්ඩ මිල දී ගැනීම	.....
D - නව කොටස් නිකුතුවක් සිදු කිරීම	.....

පිළිතුර

46. A - අඩුවේ (01)
B - වැඩිවේ (01)
C - වෙනස් නොවේ (01)
D - අඩුවේ (01)

47. ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක පහත සඳහන් කුමන පිරිවැය අයිතම ප්‍රාථමික පිරිවැයෙහි උපාංග ලෙස වර්ග කළ හැකි ද?

පිරිවැය අයිතමය	**ප්‍රාථමික පිරිවැයෙහි උපාංගයකි (ඔව්/නැත)**
A - වඩුකාර්මික වේතන	.....
B - කර්මාන්තශාලාවේ විදුලි ගාස්තු	.....
C - භාවිත කළ ලීවල පිරිවැය	.....
D - යන්ත්‍ර ක්ෂය	.....

පිළිතුර

47. A - ඔව් (01)
B - නැත (01)
C - ඔව් (01)
D - නැත (01)

● **ප්‍රශ්න අංක 48 සහ 49 ට පිළිතුරු සැපයීමට පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් විසින් විශේෂිත වර්ගයක ජංගම දුරකථනයක් නිෂ්පාදනය කර ඒකකයක් රු. 25000 ක මිලකට විකුණනු ලබයි. සමාගමේ ඉදිරි වර්ෂය සඳහා අයවැයගත විකුණුම්, ඒකක 400 ක් වන අතර එය එහි ධාරිතාවයෙන් 80% කට සමාන වේ. මෙම මෙහෙයුම් මට්ටමේදී අයවැයගත පිරිවැය පහත පරිදි වේ.

සෘජු අමුද්‍රව්‍ය	රු. 4000000
සෘජු ශ්‍රමය	රු. 2000000 (නිපදවන ඒකක ප්‍රමාණය මත ගෙවනු ලැබේ)
මුළු පොදු කාර්යය පිරිවැය:	ස්ථාවර රු. 750000, විචල්‍ය රු. 1000000

48. පහත දැ ගණනය කරන්න:

(අ) සමවිච්ඡේද ලක්ෂ්‍යය (ඒකක) : .....

(ආ) ආරක්ෂිත ආන්තිකය (රුපියල්) : .....

පිළිතුර

48. (අ) ඒකක 100 (02)
(ආ) රු 7,500 000 (02)

49. විකුණුම් මිල 10% කින් අඩු වීම නිසා, විකුණුම් ඒකක ගණන සමාගමේ ධාරිතාවයෙන් 90% ක් දක්වා වැඩි වූයේ නම්, ලාභයේ **වැඩි වීම** හෝ **අඩු වීම** කොපමණ ද?

.....

පිළිතුර

49. රු 750 000, අඩුවේ
(02) (02)

50. අනිකුත් සාධක වෙනස් නොවන්නේ නම් පහත එක් එක් අවස්ථා නිසා ආයෝජන ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩි වේ** ද, **අඩු වේ** ද, **වෙනස් නොවේ** ද යන්න සඳහන් කරන්න.

අවස්ථාව	ශුද්ධ වර්තමාන අගය මත බලපෑම
A - ආරම්භක ආයෝජනයේ වැඩි වීමක්	:.....
B - වාර්ෂික ක්ෂයවීම්වල වැඩි වීමක්	:.....
C - අපේක්ෂිත වාර්ෂික මුදල් ගලා යෑම්වල අඩු වීමක්	:.....
D - වට්ටම් අනුපාතයේ අඩු වීමක්	:.....

පිළිතුර

50. A - අඩුවේ (01)
B - වෙනස් නොවේ (01)
C - වැඩිවේ (01)
D - වැඩිවේ (01)

* * *

2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:

I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ



* මූලධර්ම පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ඇතුළත් කර තිබූ ප්‍රශ්න අංක 1, 2, 7, 20, 47 යන ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 75%කට වඩා වැඩි ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සැපයීමට සමත්ව ඇති බව ඉහත ප්‍රස්තාරයට අනුව තහවුරුවේ.

* ඉහත ප්‍රස්තාරය අනුව ප්‍රශ්න අංක 3, 43, 44, 48, 49 ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් 20%කට වඩා අඩු ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුර සපයා ඇත. එයින් ප්‍රශ්න අංක 44 යන 49 සඳහා නිවැරදි පිළිතුර සපයා ඇත්තේ 10% කට වඩා අඩු අයදුම්කරුවන් ප්‍රමාණයකි. ප්‍රමිත හා සංකල්ප අතර සම්බන්ධය, කල්බදු ගිණුම්කරණ ගැටළු, පිරිවැය, ලාභ පරිමා විශ්ලේෂණය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වේ.

* ප්‍රශ්න අංක 05, 10, 11, 15, 19, 38, 39, 45, 50 යන ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගෙන් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ, 40%-50% අතර ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නවලින් පරීක්ෂා කිරීමට උත්සාහ කර ඇත්තේ, ගිණුම්කරණ සමීකරණය, මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව, තොග නිකුත් කිරීමේ මිල ක්‍රම, හවුල් ආඥාපනතේ විධිවිධාන, කොටස් නිකුතුව, සාමාජික මුදල් ගැළපීම, අනුපාත විශ්ලේෂණය ආයෝජන ඇගයීමේ ශිල්ප ක්‍රම පිළිබඳ දැනුම හා අවබෝධයයි.

* ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුවාට ගිණුම්කරණ අභ්‍යාස ඉදිරිපත් කිරීමේදී ප්‍රායෝගික මට්ටමේ නිපුණතා පාදක කරගෙන අදාළ ගැටළු හා පිළිතුරු සාකච්ඡා කරන්නේ නම් එය සිසුනට වඩාත් සාර්ථකව පිළිතුරු සැපයීම සඳහා උපකාරී වනු ඇත.

2.1.6 I වන ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ප්‍රතිශතය					
		1	2	3	4	5	කිසිදු පිළිතුරක් සපයා නොමැත
1	5	2%	3%	15%	4%	**76%**	
2	1	**76%**	5%	8%	8%	3%	
3	5	4%	12%	28%	37%	**19%**	
4	1	**68%**	19%	7%	3%	3%	
5	1	**43%**	6%	5%	43%	3%	
6	2	7%	**67%**	8%	14%	3%	1%
7	3	6%	3%	**78%**	4%	9%	
8	1	**66%**	8%	6%	7%	12%	1%
9	4	13%	27%	14%	**38%**	7%	1%
10	1	**48%**	6%	9%	3%	34%	
11	3	6%	30%	**47%**	8%	7%	2%
12	4	13%	30%	12%	**35%**	10%	
13	2	11%	**36%**	32%	16%	5%	
14	1	**54%**	22%	9%	8%	6%	1%
15	1	**44%**	16%	25%	6%	9%	
16	4	3%	14%	10%	**59%**	13%	1%
17	5	8%	38%	21%	8%	**23%**	2%
18	1	**58%**	15%	9%	8%	9%	1%
19	1	**40%**	12%	10%	10%	28%	
20	2	3%	**75%**	4%	3%	15%	
21	5	13%	10%	8%	11%	**57%**	1%
22	3	32%	14%	**29%**	6%	19%	
23	3	5%	9%	**57%**	20%	8%	1%
24	3	18%	13%	**30%**	15%	24%	
25	4	18%	8%	12%	**56%**	5%	1%
26	2	17%	**62%**	9%	9%	2%	1%
27	5	5%	9%	22%	27%	**36%**	1%
28	2	18%	**54%**	11%	9%	7%	1%
29	2	8%	**59%**	14%	7%	11%	1%
30	5	2%	7%	5%	16%	**69%**	1%

වගුව 01

අංක 1 සිට 30 තෙක් ප්‍රශ්නවලට ප්‍රතිචාර ලෙස එක් එක් වරණය තෝරන ලද අයදුම්කරුවන්ගේ ප්‍රතිශත ඉහත වගුව 01හි දැක්වේ. ප්‍රශ්න සඳහා නිවැරදි වරණය තෝරන ලද ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. ඒ අතුරින් විශේෂතා හඳුනාගත් ප්‍රශ්න කිහිපයක් පිළිබඳ ව විග්‍රහයක් පහත දැක්වේ.

ප්‍රශ්න අංක 3 සඳහා නිවැරදි පිළිතුර වූ 5 වන වරණය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 19%ක් පමණි. ප්‍රශ්නය නිවැරදිව වටහා නොගැනීම නිසා අයදුම්කරුවන්ගෙන් 37%ක් 4 වන වරණය ද, 28%ක් 3 වන වරණය ද නිවැරදි වරණය වශයෙන් තෝරාගෙන තිබුණි. වගකීම් සහතික මත ප්‍රතිපාදනයක් කිරීමට අදාළ ගිණුම්කරණ සංකල්ප පිළිබඳ නිශ්චිත අවබෝධය අඩු මට්ටමක පවතින බව අනාවරණය වේ. එයට මූලිකව බලපා ඇති හේතුව ලෙස පෙනී යන්නේ ගිණුම්කරණ සංකල්පවල ප්‍රායෝගික යොදා ගැනීම පිළිබඳ ව අයදුම්කරුවන්ගේ අවබෝධයේ පවතින දුර්වලතාවයයි. මෙම දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ගිණුම්කරණ සංකල්ප, ඒවායේ යෙදීම් පිළිබඳ ව නිදසුන් සහිතව පන්ති කාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 17 සඳහා නිවැරදි පිළිතුර වන 5 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 23%ක් පමණි. මෙම ප්‍රශ්නය නිවැරදිව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 38%ක් 2 වන වරණය නිවැරදි පිළිතුර ලෙසත් තවත් 21%ක් නිවැරදි පිළිතුර ලෙස 3 වන වරණයක් තෝරා ගෙන තිබුණි. ඒ අනුව අයදුම්කරුවන්ගෙන් විශාල ප්‍රතිශතයක් වැරදි පිළිතුරු තෝරා ගැනීමේ හේතුව වනුයේ හවුල්කරුවන්ගේ හිමිකම වැඩිවීමේ ප්‍රමාණය ගණනය කිරීමේදී කීර්තිනාමය පොත්වලින් ඉවත් කළ ද හවුල්කරුවන්ගේ මුළු හිමිකමේ කොටසක් ලෙස සලකා තිබීමයි. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම්වලින් ගැලපීම තුළින් හවුල්කරුවන්ගේ හිමිකමේ වෙනසක් සිදු වුවද මුළු හිමිකම් වෙනසක් සිදු නොවන බව සිසුනට අවබෝධය ලබාදීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 22 සඳහා නිවැරදි පිළිතුර වූ 3 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 29%ක් පමණි. මෙම ප්‍රශ්නය නිවැරදිව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 32%ක් 1 වන වරණය ද 19%ක් 5 වන වරණය ද නිවැරදි පිළිතුර ලෙස තෝරා ගෙන තිබුණි. ඒ අනුව අයදුම්කරුවන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් වැරදි පිළිතුරු තේරීම සඳහා හේතු වනුයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වගකීම් පිළිබඳ ප්‍රතිපාදන හඳුනා ගැනීමේ අවබෝධය පහළ මට්ටමක පැවැතීමයි. මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ නිපුණතාවය වර්ධනය කිරීම සඳහා LKAS 37 පිළිබඳ අවබෝධය වර්ධනය වන අයුරින් ප්‍රායෝගික නිදසුන් ඇසුරෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 24 සඳහා නිවැරදි පිළිතුර වූ 3 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 30%ක් පමණි. ප්‍රශ්නය නිවැරදි ව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 24%ක් 5 වන වරණය ද 18%ක් 1 වන වරණය ද 15%ක් 4 වන වරණය ද නිවැරදි පිළිතුර ලෙස තෝරා ගෙන තිබුණි. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් ඉහළ ප්‍රතිශතයක් වැරදි පිළිතුරු තෝරා ගැනීමට හේතුව විය හැක්කේ ගණුදෙනු හා සිද්ධීන් ජංගම වත්කම් හා ජංගම වගකීම්වලට බලපාන ආකාරය නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී තිබීමයි. මෙම දුර්වලතාවය මඟ හැරවීම සඳහා ගිණුම්කරණ අනුපාත ගණනය කිරීමේ ගැටළුවලට සීමා නොවී, අනුපාත සකස් වී ඇති ආකාරය සහ ඒවායේ අර්ථය අවබෝධ වන ලෙස ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 12 සඳහා නිවැරදි පිළිතුර වූ 4 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 35%ක් පමණි. ප්‍රශ්නය නිවැරදි ව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්රුවන්ගෙන් 30%ක් 2 වන වරණය තම නිවැරදි වරණය ලෙස තෝරා ගෙන තිබුණි. මෙයට හේතු විය හැක්කේ LKAS 16 අනුව දේපල පිරියත හා උපකරණ මුල්වරට හඳුනාගැනීමේ පිරිවැය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීමයි. මේ අනුව ප්‍රායෝගික නිදසුන් යොදා ගනිමින් ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 13 සඳහා නිවැරදි පිළිතුර වූ 2 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 36%ක් පමණි. ප්‍රශ්නය නිවැරදි ව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 32%ක් 3 වන වරණය සිය නිවැරදි පිළිතුර ලෙස තෝරා ගෙන තිබුණි. මෙයට හේතුව විය හැක්කේ, තොගවල වෙනස්වීම (අඩුවීම/වැඩිවීම) ප්‍රාථමික පිරිවැයට සහ විකුණුම් පිරිවැයට බලපාන ආකාරය පිළිබඳ අවබෝධය අඩු මට්ටමක පැවතීමයි. මේ අනුව පිරිවැය ව්‍යුහයේ සංයුතිය පිළිබඳ අවශ්‍ය ප්‍රායෝගික දැනුම ලබාදෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 27 සඳහා නිවැරදි පිළිතුර වූ 5 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 36%ක් පමණි. මෙම ප්‍රශ්නය නිවැරදිව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 27%ක් 4 වන වරණය ද 22%ක් 3 වන වරණය ද නිවැරදි පිළිතුර ලෙස තෝරා ගෙන තිබුණි. මෙසේ වැරදි පිළිතුරු තෝරා ගැනීමට හේතු විය හැක්කේ අන්තර්ග්‍රහණය කරන ලද පිරිවැය ද ඇතුළත් කරමින් ඒකක පිරිවැය ලබාගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය අඩු බවයි.

ප්‍රශ්න අංක 19 සඳහා නිවැරදි පිළිතුර වූ 1 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 40%ක් පමණි. මෙම ප්‍රශ්න නිවැරදි ව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 28%ක් 5 වන වරණය නිවැරදි පිළිතුරු ලෙස තෝරා ගෙන තිබුණි. මෙසේ වැරදි පිළිතුරු තෝරා ගැනීමට හේතු විය හැක්කේ කොටස් නිකුතුව පිළිබඳ අවබෝධය අඩුනිසා බව පෙනී යයි. තවද ඇතැම් අපේක්ෂකයින් මෙය ප්‍රසාද කොටස් නිකුතුව ලෙස සලකා 5 වන වරණය තම පිළිතුර ලෙස තෝරා තිබුණි. මේ අනුව ගිණුම් තැබීමේදී ප්‍රසාද කොටස් නිකුතුව හා හිමිකම් නිකුතුව අතර වෙනස හොඳින් අවධාරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 15 සඳහා නිවැරදි පිළිතුර වූ 1 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 44%ක් පමණි. මෙම ප්‍රශ්නය නිවැරදි ව වටහා ගෙන නොතිබීම නිසා අයදුම්කරුවන්ගෙන් 25%ක් 3 වන වරණය නිවැරදි පිළිතුර ලෙස තෝරා ගෙන තිබුණි. මෙයට හේතු විය හැක්කේ ඇතැම් අපේක්ෂකයින් ලාභලාභ විසර්ජනය සහ ලාභය ගණනය කිරීම යන අවස්ථා ලෙස නිවැරදිව අවබෝධ කරගෙන නොතිබීම බව පෙනේ. ලාභය ගණනය කිරීම හා ගණනය කරන ලද ලාභය විසර්ජනය කිරීම යන සංකල්ප අතර වෙනස මනාව අවබෝධ වන අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 11 සඳහා නිවැරදි පිළිතුර වූ 3 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 47%ක් පමණි. මේ අනුව තොග ප්‍රමිතයට අනුව පිරිවැය සූත්‍ර භාවිතා කර තොගවල පිරිවැය ගණනය කිරීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී මේ පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත.

ප්‍රශ්න අංක 14 සඳහා නිවැරදි පිළිතුර වූ 1 වන වරණය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 54%කි. අයදුම්කරුවන්ගෙන් 46%ක් ම නිවැරදි වරණය තෝරා ගැනීමට අපොහොසත් වී ඇත්තේ පිරිවැය මත ලබාදුන් දළ ලාභ අනුපාතය විකුණුම්වලට ගළපා ගැනීමට ඇති අවබෝධයේ අඩුකම බව පෙනී යයි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අනුපාත ගණනය කිරීමට සීමා නොවී අනුපාත පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීම වැදගත් වනු ඇත.

5 වන ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර වූ 1 වන වරණය සඳහා 43%ක ප්‍රතිචාර දක්වන අතර 4 වන වරණය සඳහා ද 43%ක් ප්‍රතිචාර දක්වා ඇත. මෙයට හේතුව වනුයේ, ලකුණු කළ මිලෙන් වෙළෙඳ වට්ටම අඩු කොට ගිණුම්ගත කිරීම කළ යුතු බව අවබෝධ කරගෙන නොතිබීමයි. මුදල් වට්ටම් සහ වෙළෙඳ වට්ටම අතර වෙනස අවබෝධ වනසේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 8 හා 9 සඳහා පිළිතුරු සැපයිය යුතු වූයේ ලබාදී ඇති පොදු තොරතුරු මතය. ප්‍රශ්න අංක 8 සඳහා නිවැරදි පිළිතුර වන 1 වන වරණයට 66%ක් වැනි ඉහළ ප්‍රතිචාරයක් තිබුණු නමුදු ප්‍රශ්න අංක 9ට නිවැරදි පිළිතුර වන 4 වන වරණය 38%ක් පමණක් තෝරාගෙන තිබුණි. මෙයට හේතුව විය හැක්කේ කාලච්ඡේද දෙකක තොරතුරු පදනම් කරගෙන කාල පරාසයන්ට අදාළ දත්තයන් නිර්මාණය කර ගැනීමේ හැකියාව අඩු මට්ටමක පැවතීමයි. ව්‍යාපාරයක ගණුදෙනු වාර්තා කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය යොදා ගැනීම වැදගත් වේ.

ප්‍රශ්න අංක 10 සඳහා නිවැරදි පිළිතුර වූ 1 වරණය තෝරාගත් ප්‍රතිශතය 48%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 34%ක්ම 5 වන වරණය නිවැරදි වරණය ලෙස තෝරාගෙන තිබුණි. එයට හේතුව විය හැක්කේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවේ මූලික ගති ලක්ෂණ පිළිබඳ අවබෝධයක් නොමැතිවීමයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙන සේ ප්‍රායෝගික නිදසුන් ද යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය					
	ලකුණු 0	ලකුණු 1	ලකුණු 2	ලකුණු 3	ලකුණු 4	කිසිදු පිළිතුරක් සපයා නොමැත
31	**1%**	11%	27%	32%	**29%**	
32	**11%**	21%	26%	22%	**18%**	**2%**
33	**10%**	9%	16%	23%	**39%**	**3%**
34	**21%**	-	28%	-	**47%**	**4%**
35	**32%**	-	32%	-	**23%**	**13%**
36	**35%**	-	39%	-	**10%**	**16%**
37	**13%**	18%	17%	18%	**29%**	**5%**
38	**23%**	11%	25%	-	**31%**	**10%**
39	**40%**	-	22%	-	**29%**	**9%**
40	**63%**	-	-	-	**22%**	**15%**
41	**50%**	-	5%	-	**32%**	**13%**
42	**39%**	-	20%	-	**25%**	**16%**
43	**68%**	-	-	-	**11%**	**21%**
44	**68%**	-	6%	-	**6%**	**20%**
45	**30%**	-	18%	-	**40%**	**12%**
46	**10%**	23%	25%	18%	**21%**	**3%**
47	**2%**	3%	6%	13%	**74%**	**2%**
48	**61%**	-	6%	-	**13%**	**20%**
49	**67%**	-	1%	-	**5%**	**27%**
50	**16%**	30%	25%	16%	**10%**	**3%**

වගුව 02

ඉහත වගුව 02 හි සඳහන්ව ඇත්තේ ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරයයි. ඒ අනුව ප්‍රශ්න අංක 40, 43, 44, 48, 49 සඳහා ලකුණු 0 (බින්දුව) ලබාගත් ප්‍රතිශතය 60% ඉක්මවා ඇති බව පෙනී යයි.

මේ අනුව සිද්ධාන්ත පිළිබඳ දැනුම වෙනත් අවස්ථාවලට ආදේශ කිරීමේ හැකියාව දුර්වල මට්ටමක පවතින බව පෙනී යයි. ප්‍රශ්න අංක 38 සඳහා මුළු ලකුණු 04 ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 31%ක් පමණි. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නයේ ස්වභාවය අනුව මෙය සෑම සිසුවෙකුම පාහේ නිවැරදි ව පිළිතුරු ඉදිරිපත් කළ යුතු ප්‍රශ්නයකි. මක්නිසාද මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග පිළිබඳ පුළුල් අවබෝධයක් උසස් පෙළ සිසුන්ගෙන් අපේක්ෂා කිරීමයි.

40 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 63%ක්ම ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇත. උපරිම ලකුණු වන ලකුණු 04 ලබාගෙන ඇත්තේ 22%ක් පමණි. මෙයට හේතුව වනුයේ ජංගම ගිණුමේ තොරතුරු මත ශුද්ධ ලාභය ගණනය කිරීමට නොහැකි වීමයි.

41 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 50%ක්ම ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇත. උපරිම ලකුණ වන ලකුණු 04 ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගේ 32%ක් පමණි. එයට හේතුව විය හැක්කේ ලාභ විසර්ජනය කිරීම සහ විසර්ජනයට අදාළ ලාභය මුදලින් ගෙවීම ගිණුම්ගත කිරීම පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීමයි. ඒ අනුව පන්ති කාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමේදී ජංගම ගිණුම හවුල්කරුවන්ගේ හිමිකමේ කොටසක් බව අවබෝධ වන පරිදි සංවිධානය කිරීම වැදගත් වේ.

43 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 68%ක්ම ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇත. උපරිම ලකුණු 04 ලබාගෙන තිබුණේ 11%ක් පමණි. ගැණුම්කරුගේ පොත්වල මූල්‍ය කල්බදු ගිණුම් තැබීම පිළිබඳ ව අවබෝධය සිසුන් තුළ අවම මට්ටමක පැවැතීම ඊට හේතුව වී ඇති බව පෙනී යයි.

44 ප්‍රශ්නය සඳහා ද අයදුම්කරුවන්ගෙන් 68%ක්ම ලකුණු 0 (බින්දුව) ලබාගෙන ඇත. ලකුණු 04 ම ලබාගෙන ඇත්තේ 6%ක් පමණි. 43 වන ප්‍රශ්නය හා සම්බන්ධ මෙම ප්‍රශ්නය සඳහා ලබාදී ඇති පිළිතුරු තුළින් පැහැදිලි වන්නේ මූල්‍ය කල්බදු පොළී හා වසර අවසානයේ කල්බදු වගකීම පිළිබඳ ව අවබෝධය අඩු මට්ටමක පැවැතීමයි. මූල්‍ය කල්බදු ගිණුම් තැබීම සම්බන්ධයෙන් අදාළ වන අභ්‍යාස ද ලබා දෙමින් සිසුන්ට වැඩි අවබෝධයක් ලබාදීම උචිත වේ.

ලබාදී ඇති පොදු තොරතුරු භාවිතයෙන් 48, 49 ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදිය යුතුව තිබුණි. ඒ අනුව 48 වන ප්‍රශ්නයට ලකුණු 0 ලබාගත් ප්‍රතිශතය 61%ක් වන අතර, ලකුණු 4 ම ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 5%ක් වැනි සුළු ප්‍රතිශතයක් පමණි. එලෙස අඩු ලකුණු ලබාගැනීමට හේතුව වී ඇත්තේ විචල්‍ය පිරිවැය ගණනය කිරීමේ දී විචල්‍ය පොදු කාර්යය පිරිවැය නොසලකා හැරීමයි. ඒ අනුව මුළු පිරිවැය ස්ථාවර හා විචල්‍ය වශයෙන් කොටස් දෙකකට වෙන් කරන බව සිසුවාට අවබෝධය ලබාදීමට හැකි වන පරිදි ප්‍රායෝගික නිදසුන් අන්තර්ගත කරමින් අභ්‍යාස සාකච්ඡා කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

විකුණුම් මිල වැඩිවීම හා ධාරිතාව වැඩිවීම තුළින් ලාභයට ඇති කෙරෙන බලපෑම (සංවේදිතා විශ්ලේෂණ) පිළිබඳ අවබෝධය 49 වන ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. ඒ පිළිබඳ අවබෝධය මඳ බව නිසා අයදුම්කරුවන්ගෙන් 67%ක් ම ලකුණු ලබාගෙන නොතිබුණි. සංවේදිතා විශ්ලේෂණය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබාදීමට යෝග්‍ය අභ්‍යාස ලබාදීම උචිත වේ.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7 කින් යුක්තය. පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර ඒ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි. සෙසු ප්‍රශ්න 5 න් 4 ක් තෝරා ගත යුතු අතර එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි. මුළු ලකුණු 100 කි.

අවසාන ලකුණු ගණනය කිරීම :

I පත්‍රය 100
II පත්‍රය 100
අවසාන ලකුණු 200 ÷ 2 = 100

* පිළිතුරු පත් ඇගයීමේ දී සෑම ප්‍රශ්නයකම ලකුණු දෙගුණ කර ලබා දෙනු ඇත.
ඒ අනුව අවසාන ලකුණු ගණනය කිරීම :

I පත්‍රය 200
II පත්‍රය 200
අවසාන ලකුණු 400 ÷ 4 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 2, 3 සහ 4, ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

01 ප්‍රශ්නය

1. 2013.03.31 දිනට සීමිත පුබුදු පොදු සමාගමේ ශේෂ පිරික්සුම් පහත දී ඇත.

	නර (රු. '000)	බැර (රු. '000)
2013.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ		
(ධාරණ වටිනාකමට)	5400	
2012.04.01 දිනට තොගය	400	
වෙළෙඳ ණයගැතියෝ	400	
මුදල් සහ මුදල් සමාන දෑ	250	
ගැනුම්	1500	
සේවක වැටුප්	400	
කාර්යාල භාණ්ඩ	360	
දේපල, පිරියත සහ උපකරණ මත ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය	700	
දුරකථන ගාස්තු	40	
අතුරු ලාභාංශ	180	
විකුණුම් කොමිස්	50	
කල්බදු වාරිකය	930	
බදු (ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද)	50	
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		2000
2012.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		1380
කල්බදු ණයකිම්යෝ		2400
වෙළෙඳ ණයකිම්යෝ		350
විකුණුම්		4500
2012.04.01 දිනට අවසානය ණය සඳහා වෙන් කිරීම්		30
	10660	10660

අතිරේක තොරතුරු:

(අ) 2013.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය පහත පරිදි වේ:

විස්තරය	පිරිවැය (රු.'000)	සමුච්චිත ක්ෂය (රු.'000)	ධාරණවටිනාකම (රු.'000)
ගොඩනැගිල්ල	2000	1200	800
මෝටර් රථය (2012.04.01 දින මුල්‍ය කල්බදු පදනම මත අත්පත් කර ගත්)	2400	-	2400
ලී බඩු සහ පවිසිරීම්	1000	400	600
කාර්යාලීය උපකරණ (2012.04.01 දින අත්පත් කර ගත්)	2000	400	1600
	7400	2000	5400

(ආ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය පහත අයිතමයන්ගෙන් සමන්විත වේ. සියලු ම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

වත්කම	ක්ෂය (රු.'000)
ගොඩනැගිල්ල	200
ලී බඩු සහ සවිකිරීම්	100
කාර්යාලීය උපකරණ	400
	700

(ඉ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැලපීම් කළ යුතු වේ.

(i) 2013.03.31 දින ගොඩනැගිල්ල රු. 1 000 000 කට අත්පිට මුදලට විකුණන ලදී. මෙම ගනුදෙනුව බැංකු ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත. ගොඩනැගිල්ලෙහි පිරිවැය සහ සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කර නොමැත.

(ii) මෝටර් රථයේ කල්බදු කාලය වසර 4 ක් වන අතර එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 5 කි. කල්බදු කාලය අවසානයේ දී මෝටර් රථයේ අයිතිය සමාගමට පැවරේ. වාර්ෂික කල්බදු වාරිකය රු. 930 000 ක් වේ. වර්ෂය තුළ දී ගෙවන ලද වාරිකය කල්බදු වාරික ගිණුමකට හර කර ඇත. වසර 4 න කාලය සඳහා කල්බදු පොලිය පහත පරිදි වේ.

වසර	පොලිය (රු.'000)
2012 / 13	480
2013 / 14	390
2014 / 15	290
2015 / 16	160

(iii) 2013.03.31 දිනට තොගයේ පිරිවැය රු. 800 000 ක් විය. එදිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 780 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) වර්ෂය අවසානයේ වෙළෙඳ ණයගැති ශේෂය මත වාර්ෂිකව 10% ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(v) 2012.04.01 දින වසර දෙසක් සඳහා එකවර කුලී ගෙවමින් කාර්යාල පරිශ්‍රය ලෙස භාවිත කිරීමට ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදී. ගෙවන ලද මුළු මුදල කාර්යාල කුලී ගිණුමට හර කර ඇත.

(vi) 2013 මාර්තු මාසය සඳහා දුරකථන ගාස්තු රු. 10 000 ක් ගෙවිය යුතු වේ.

(vii) සමාගම විසින් වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. මෙම වගකීම් සහතිකය සඳහා විකුණුම් අගය මත 2% ක ප්‍රතිපාදනයක් කළ යුතු යැයි විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනික කරමින් කොටසක් රු. 50 බැගින් සාමාන්‍ය කොටස් 20 000 ක් දනට පිටින කොටස්කරුවන්ට නිකුත් කර ඇත.

(ix) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු, බදු පෙර ලාභයෙන් $\frac{1}{4}$ ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

අවශ්‍යවන්නේ:

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත පුබුදු පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(2) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2013.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය)

(ලකුණු 20 යි)

ප්‍රශ්න අංක 01 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පාටිපාටිය

(1)

සීමිත පුබුදු පොදු සමාගම
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)
ආදායම් ප්‍රකාශනය

(රු'000)

	සටහන්			
විකුණුම්			3 500	(01)
විකුණුම් පිරිවැය			(1 100)	(02) → පෙර වැඩ බලන්න
දළ ලාභය			(01) 2 400	
වෙනත් ආදායම්	01		200	(01)
			2 600	
බෙදා හැරීමේ වියදම්		130	(02)	
පරිපාලන වියදම්		1 810	(04)	→ පෙර වැඩ බලන්න
වෙනත් වියදම්		20	(01)	
මූල්‍ය වියදම්		480	(01) (2 440)	
බදු පෙර ලාභය	02		160	
ආදායම් බදු			(01) (40)	→ ලද ලාභයෙන් 1/4ක් සඳහා ලකුණු හිමිය.
වර්ෂයේ ලාභය (01)			120	

සටහන් අංකය 01 :- වෙනත් ආදායම් (රු 000)

ගොඩනැගිලි විකුණුම් ලාභය 200

සටහන් අංකය 02 :-

බදු පෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩුකිරීමෙන් පසුවය

		(රු'000)
කල්බදු පොලී	(01)	480
තොග අලාභ		20
වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන		70
දේපල පිරියත සහ උපකරණ මත ක්ෂය		1 180

වටිනාකම සමග ඕනෑම අයිතම 2ක් සඳහා ලකුණු 2 හිමිවේ.

(ලකුණු 18)

පෙර වැඩ (රු'000) :

විකුණුම් පිරිවැය

ආරම්භක තොගය	400	
ගැනුම්	1 500	(01)
	1 900	
අවසාන තොගය	(800)	(01)
	1 100	

	බෙදා හැරීමේ වියදම්	පරිපාලන වියදම්	වෙනත් වියදම්	රඳවාගත් ඉපැයුම්
අඩමාන ණය	10 (01)			
වගකීම් සහතික මත ප්‍රතිපාදන	70 (01)			
විකුණුම් කොමිස්	50			
තොග අලාභ			20 (01)	
කල්බදු පොලී				480 (01)
කාර්යාල කුලී		180 (01)		
දුරකථන ගාස්තු		50 (01)		
සේවක වැටුප්		400		
ක්ෂයවීම් (700 + 480)		1 180 (02)		
[01] [01]	130	1 810	20	480

(2)

සීමිත පුබුදු පොදු සමාගම
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(රු'000)

	ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රඳවාගත් ඉපැයුම්	එකතුව
2012.04.01 ශේෂය	2 000	1 380	3 380
වර්ෂයේ ලාභය	-	(01) 120	120
සංචිත ප්‍රාග්ධනිත කිරීම	1 000	(1 000)	-
අතුරු ලාභාංශ	- (01)	(180) (01)	(180)
	3 000 (01)	320	3 320

(ලකුණු 04)

(3)

සීමිත පුබුදු පොදු සමාගම
2013.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (01)

සටහන් (රු'000)

	සටහන්		
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	03		(01) 4 120 → ලද අගයට
ජංගම වත්කම්			
තොගය		780 (01)	
වෙළඳ ණයගැතියෝ		360 (01)	
ඉදිරියට ගෙවූ කාර්යාල කුළී		180 (01)	
ඉදිරියට ගෙවූ ආදායම් බදු		(01) 10	→ ලද අගයට
මුදල් සහ මුදල් සමාන දෑ		250	1 580
			5 700
හිමිකම් හා වගකීම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය			(01) 3 000 → ලද අගයට
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය			
සංචිත			(01) 320
රඳවා ගත් ඉපැයුම්			
ජංගම නොවන වගකීම්			1 410 (01)
කල්බදු ණයහිමියෝ			
ජංගම වගකීම්			
කල්බදු ණයහිමියෝ		540 (01)	
වෙළඳ ණයහිමියෝ		350	
උපචිත දුරකථන ගාස්තු		10 (01)	
වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන		70 (01)	970
			5 700

සටහන් අංකය 03 - දේපල, පිරියත සහ උපකරණ

(රු'000)

පිරිවැය	2012.04.01 ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්	2013.03.31ශේෂය
ගොඩනැගිලි	2000	-	(2000) (01)	-
මොටර් රථ	-	2400 (01)	-	2400
ලීබඩු හා සවිකිරීම්	1000	-	-	1000
කාර්යාල උපකරණ	-	2000 (01)	-	2000
	3000	4400	(2000)	5400
ක්ෂය වෙන් කිරීම්	2012.04.01 ශේෂය	වර්ෂයේ ක්ෂය	ඉවත් කිරීම්	2013.03.31 ශේෂය
ගොඩනැගිලි	1000	200	(1200) (01)	-
මොටර් රථ	-	480 (02)	-	480
ලීබඩු හා සවිකිරීම්	300	100	-	400
කාර්යාල උපකරණ	-	400	-	400
	1300	1180	(1200)	1280
2013.03.31 දිනට ධාරණ වටිනාකම	1700	3220	800	4120

(ලකුණු 18)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
1 ප්‍රශ්නය අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 99%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 15%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 36%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයේ අනුකොටස් 3ක් ඇති අතර අනු කොටස් තුනේම පහසුතාව 40%ට වඩා වැඩිය. පහසුතාව අඩුම අනු කොටස (3) වී ඇති අතර, එහි පහසුතාව 42%කි. පහසුතාව වැඩිම අනුකොටස (1) වී ඇති අතර, එහි පහසුතාව 49%කි.

(1) වන කොටසේ පහසුතාව 49%ක් වන අතර ඊට හේතු ලෙස ප්‍රධාන වශයෙන් මූල්‍ය කල්බදු පදනම මත අත්පත් කරගත් මෝටර් රථයේ ක්ෂය ප්‍රමාණය නිවැරදි ව ගණනය කර නොතිබීම, වගකීම් සහතිකය සඳහා නිවැරදි ව ප්‍රතිපාදනයක් කර නොතිබීම සිසුන් විසින් කරන ලද දෝෂ ලෙස දැක්විය හැකිය. සමාගම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ අවබෝධය පහළ මට්ටමක පවතින බැවින් එම ප්‍රමිත පිළිබඳ අවබෝධය තහවුරු වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුවේ.

(3) වන කොටසේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු ණයහිමියෝ, ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබීම, වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන නිවැරදි ව හඳුනාගෙන නොතිබීම ආදී දුර්වලතා පවතින බව පෙනේ. මූල්‍ය කල්බදු යටතේ ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බැවින් ඒ පිළිබඳ දැනුම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ලබාදිය යුතුවේ.

02 ප්‍රශ්නය

2. (අ) **මහේන්ද්‍ර, නාරද** සහ **රාජිත** ලාභඅලාභ පිළිවෙළින් 5:3:2 අනුපාතයට බෙදා ගන්නා වෙළඳ ව්‍යාපාරයක භවුල්කරුවෝ ය. 2012.03.31 දිනට මෙම භවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය) පහත පරිදි විය.

	රු.'000	රු.'000
ජංගම නොවන වත්කම්		
දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට	1000	
සමුච්චිත ක්ෂය	(200)	800
ජංගම වත්කම්		
තොගය	200	
වෙළෙඳ ණයගැතියෝ	450	
මුදල්	60	710
		1510
ප්‍රාග්ධන ගිණුම්		
මහේන්ද්‍ර	200	
නාරද	400	
රාජිත	200	800
ජංගම ගිණුම්		
මහේන්ද්‍ර	150	
නාරද	100	
රාජිත	60	310
ජංගම නොවන වගකීම්		
5% ණය - නාරද		200
ජංගම වගකීම්		
වෙළෙඳ ණයහිමියෝ		200
		1510

අතිරේක තොරතුරු :

(i) 2012.04.01 දින රාජිත භවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. ඔහුට ගෙවිය යුතු මුදල ණයක් ලෙස සැලකීමටත් ඒ සඳහා 5% ක වාර්ෂික පොලියක් ගෙවීමටත් එකඟ විය. එදිනට භවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 200 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර ඒ සඳහා සියලු ගැළපීම් භවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් කළ යුතු වේ.

(ii) මහේන්ද්‍ර සහ නාරද පහත කොන්දේසි මත භවුල් ව්‍යාපාරය පවත්වා ගැනීමට එකඟ විය:
   (අ) සෑම භවුල්කරුවකුට ම රු. 120 000 ක වාර්ෂික වේතනයක් හිමි වේ.
   (ආ) ලාභඅලාභ සම සමව බෙදා ගනේ.

(iii) වර්ෂය තුළ දී මහේන්ද්‍ර සහ නාරද පිළිවෙළින් රු. 200 000 ක සහ රු. 150 000 ක ගැනිලි මුදලින් ලබා ගෙන ඇත.

(iv) භවුල් ව්‍යාපාරයේ සියලුම විකුණුම් සහ ගැනුම් ණය පදනම මත කරනු ලැබේ. වර්ෂය තුළ දී ණයගැතියන්ගෙන් රු. 1 800 000 ක් එකතු කර ගන්නා ලද අතර ණයහිමියන්ට රු. 900 000 ක් ගෙවන ලදී.

(v) වර්ෂය තුළ ගෙවූ මෙහෙයුම් වියදම් රු. 350 000 කි.

(vi) ණය සඳහා පොලී ගෙවිය යුතු වේ.

(vii) දේපල, පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(viii) 2013.03.31 දිනට භවුල් ව්‍යාපාරයේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් පහත පරිදි වේ.

	රු.'000
තොගය	275
වෙළෙඳ ණයගැතියෝ	500
මුදල්	260
වෙළෙඳ ණයහිමියෝ	300

අවශ්‍යවන්නේ:

මහේන්ද්‍ර සහ නාරද භවුල් ව්‍යාපාරයේ පහත දැ:

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (භවුල්කරුවන්ට කරන විසර්ජනයන් ද ඇතුළුව)

(2) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

(3) 2013.03.31 දිනට රාජිතගේ ණය ගිණුම

(ලකුණු 10 යි)

(ආ) නිෂ්පාදන සමාගමක අසම්පූර්ණ අයවැයගත පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාවක් පහත දී ඇත:

පොදු කාර්ය පිරිවැය	විගජන පදනම	යන්ත්‍ර දෙපාර්තමේන්තුව (රු.'000)	නිමැවුම් දෙපාර්තමේන්තුව (රු.'000)	නඩත්තු දෙපාර්තමේන්තුව (රු.'000)	එකතුව (රු.'000)
බෙදහරින ලද පොදු කාර්ය පිරිවැය		820	480	190	1490
විදුලිය					240
කුලිය					180
යන්ත්‍ර ක්ෂය					150
සේවක සුබසාධන වියදම්					300

අතිරේක තොරතුරු:

(i)

විස්තරය	යන්ත්‍ර දෙපාර්තමේන්තුව	නිමැවුම් දෙපාර්තමේන්තුව	නඩත්තු දෙපාර්තමේන්තුව	එකතුව
කිලෝවොට් පැය	15000	6000	3000	24000
යන්ත්‍ර පිරිවැය (රු.)	1000000	500000	-	1500000
බිම් ප්‍රමාණය (වර්ග මීටර)	200	100	60	360
සේවක සංඛ්‍යාව	25	100	25	150

(ii) නඩත්තු දෙපාර්තමේන්තුව එහි සේවාවන්ගෙන් 60% ක් යන්ත්‍ර දෙපාර්තමේන්තුවටත් ඉතිරිය නිමැවුම් දෙපාර්තමේන්තුවටත් සපයයි.

(iii) යන්ත්‍ර දෙපාර්තමේන්තුව සහ නිමැවුම් දෙපාර්තමේන්තුව පිළිවෙළින් යන්ත්‍ර පැය සහ සෘජු ශ්‍රම පැය මත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබයි.

(iv) සමාගම විසින් නිපදවනු ලබන භාණ්ඩ දෙක සඳහා පහත තොරතුරු අදළ වේ.

විස්තරය	A වර්ගය	B වර්ගය
ඒකකයක ප්‍රාථමික පිරිවැය (රු.)	700	720
ඒකකයක් සඳහා අවශ්‍ය පැය (අයවැයගත):		
- යන්ත්‍ර පැය	5	6
- සෘජු ශ්‍රම පැය	4	8
නිෂ්පාදන ඒකක (අයවැයගත)	1000	1500

අවශ්‍යවන්නේ:

(1) සම්පූර්ණ කරන ලද පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (නඩත්තු දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළුව)

(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) 'A' හා 'B' භාණ්ඩ සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය

(ලකුණු 10)

ප්‍රශ්න අංක 02 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පාටිපාටිය

02. (අ) (1)

මහේන්ද්‍ර හා නාරද හවුල් ව්‍යාපාරය
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

(රු'000)

විකුණුම්		1 850 (02) → පෙර වැඩ බලන්න
2012.04.01 තොගය	200	
ගැණුම්	1 000 (02)	→ පෙර වැඩ බලන්න
	1 200	(01)
අවසාන තොගය	(275)	(925)
දළ ලාභය		925
වියදම්		
මෙහෙයුම් වියදම	350	
දේපල පිරියත උපකරණ ක්ෂය	200 (01)	
ණය පොලී (25 + 10)	35 (02)	(585)
		340
වර්ෂයේ ලාභය		
වේතන - මහේන්ද්‍ර	120	
නාරද	120 (01)	(240)
ලාභ කොටස් - මහේන්ද්‍ර	50	
නාරද	(01) 50	(100)
ලද අගයට		

(ලකුණු 10)

පෙර වැඩ :

ණයගැති පාලන ගිණුම

ශේෂය ඉ/ගෙ	450	මුදල්	1800
විකුණුම්	1850		
		ශේෂය ප/ගෙ	500
	2300		2300

(අයිතම 2කට 1 බැගින් ලකුණු 02 යි)

ණයහිමි පාලන ගිණුම

මුදල්	900	ශේෂය ඉ/ගෙ	200
		ගැනුම්	1000
ශේෂය ප/ගෙ	300		
	1200		1200

(අයිතම 2කට 1 බැගින් ලකුණු 02 යි)

(2) **ප්‍රාග්ධන ගිණුම්**

(රු'000)

	මහේන්ද්‍ර	නාරද	රාජිත		මහේන්ද්‍ර	නාරද	රාජිත
කීර්තිනාමය	600	600	-	ශේෂය ඉ/ගෙ	200	400	200
ණය ගිණුම - රාජිත	- (01)	-	500	කීර්තිනාමය	600	360	240
ශේෂය ප/ගෙ (01)	200	160	-	ජංගම ගිණුම	-	(01)	60
	800	760	500		800	760	500
				ශේෂය ඉ/ගෙ	200	160	

කීර්තිනාමය ශුද්ධ ප්‍රතිඵලය වාර්තා කර ඇත්නම් මුළු ලකුණු හිමිවේ.

ජංගම ගිණුම් (රු'000)

	මහේන්ද්‍ර	නාරද	රාජිත		මහේන්ද්‍ර	නාරද	රාජිත
ප්‍රාග්ධනය - රාජිත	-	-	60	ශේෂය ඉ/ගෙ	150	100	60
ගැනිලි	200	150	-	ණය පොලී (01)	-	10	-
		(01)		වේතන (01)	120	120	-
ශේෂය ප/ගෙ (01)	120	130	-	ලාභ කොටස් (01)	50	50	-
	320	280	60		320	280	60
ලද අගයට				ශේෂය ඉ/ගෙ	200	130	-

ලද අගයට

(ලකුණු 08)

	ණය ගිණුම - රාජිත			රු'000
ශේෂය ප/ගෙ	500		ප්‍රාග්ධන ගිණුම	500 (02)
	500			500
			ශේෂය ඉ/ගෙ	500

විකල්පය :

	ණය ගිණුම - රාජිත			රු'000
ශේෂය ප/ගෙ	500		ප්‍රාග්ධන ගිණුම - රාජිත	440 (01)
			ජංගම ගිණුම - රාජිත	60 (01)
	500			500
			ශේෂය ඉ/ගෙ	500

(ලකුණු 02)

(ආ) (1) පොදු කාර්ය විභාජන පත්‍රිකාව

(රු'000)

අයිතමය	විභාජන පදනම	නිෂ්පාදන දෙපාර්තමේන්තු		සේවා දෙපාර්තමේන්තු	එකතුව
		යන්ත්‍ර	නිමැවුම්	නඩත්තු	
බෙදා හරින ලද පොදු කාර්යය පිරිවැය	-	820	480	190	1 490
විදුලිය	කිලෝ වොට් පැය/ 5 : 2 : 1 (01)	150	60 (01)	30	240
කුලිය	බිම් ප්‍රමාණය/ 10 : 5 : 3 (01)	100	50 (01)	30	180
යන්ත්‍ර ක්ෂය	යන්ත්‍ර පිරිවැය/ 2 : 1 (01)	100	50 (01)	-	150
සේවක සුබ සාධක වියදම්	සේවක සංඛ්‍යාව/ 1 : 4 (01)	50	200 (01)	50	300
නඩත්තු සේවා	සේවා සැපයුම/ 3 : 2	1 220	840	300	2 360
		(01) 180	(01) 120	(300)	-
		1 400	960	-	2 360

ලද අගය නිවැරදිව බෙදීමට ලකුණු හිමිවේ.

(ලකුණු 10)

(2) **පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත :**

යන්ත්‍ර දෙපාර්තමේන්තුව = **යන්ත්‍ර පැයකට රු 100** (03)

පෙරවැඩ : **(රු)**

ලද අගයට $\longrightarrow$ (01) $\dfrac{1\,400\,000}{5\,000\ (01)\ +\ 9\,000\ (01)} = 100$

නිමවුම් දෙපාර්තමේන්තුව සෘජු ශ්‍රම පැයකට රු 60 (03)

පෙරවැඩ : **(රු)**

ලද අගයට $\longrightarrow$ (01) $\dfrac{960\,000}{4\,000\ (01)\ +\ 12\,000\ (01)} = 60$

(ලකුණු 06)

(3)

	A වර්ගය	**B වර්ගය**
ඒකකයක නිෂ්පාදන පිරිවැය	**රු 1 440** (02)	**රු 1 800** (02)

පෙරවැඩ :	A වර්ගය (රු)	B වර්ගය (රු)
ප්‍රාථමික පිරිවැය	700	720
පොදු කාර්ය පිරිවැය :	(01) 500 **(5×100)**	(01) 600 (6×100)
යන්ත්‍ර දෙපාර්තමේන්තුව	(01) 240 **(4×60)**	(01) 480 (8×60)
නිමවුම් දෙපාර්තමේන්තුව	1 440	1 800

(ලකුණු 06)

(ලකුණු 04)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 x 2 = ලකුණු 40කි.
2 වන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයක් වුවත් ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 98%ක් පමණි.
ඉන් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 20 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 21 - 30 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 31 - 40 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 31ට වඩා ලකුණු ලබාගත් පිරිස අයදුම්කරුවන්ගෙන් 24%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 28%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ට වඩා අඩුවෙනි.



අනුකොටස් 6කින් යුක්ත මෙම ප්‍රශ්නයේ අනුකොටස් හයේම පහසුතාව 35%ට වඩා ඉහළය. පහසුතාව වැඩිම අනුකොටස (ආ) (1) වන අතර එහි පහසුතාවය 77%කි. පහසුතාව අඩුම අනුකොටස (ආ) (3) වේ. එහි පහසුතාව 35%කි.

2 වන ප්‍රශ්නයේ (අ) (1) කොටසේ පහසුතාව 62%කි. ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම තුළින් වසරේ ගැනුම් හා විකුණුම් නිවැරදිව ගණනය කිරීමට නොහැකි වීම, හවුල්කරුවකු වූ නාරද ව්‍යාපාරයට සපයා තිබූ ණය සඳහා 5%ක පොලිය ගලපා නොතිබීම යන දුර්වලතා සිදුවී තිබුණි.

(අ) (2)කොටසේ පහසුතාව 60%කි. කීර්තිනාමය නිවැරදිව ප්‍රාග්ධන ගිණුම්වල ගලපා නොතිබීම, ජංගම ගිණුම තුළ හවුල්කරුවකු වූ නාරදගේ ණය පොලිය සටහන් වී නොතිබීම යන පොදු දුර්වලතා අයදුම්කරුවන් විසින් සිදුකර තිබුණි.

(අ) 3 වන කොටසේ පහසුතාව 41%කි. විශ්‍රාම යන හවුල්කරුගේ හිමිකම, ණය ගිණුම තුළ නිවැරදිව ගණනය කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශය, ඉපයූ ලාභය විසර්ජනය කිරීම, කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපීම, විශ්‍රාම යන හවුල්කරුගේ හිමිකම ණය ගිණුම තුළ ගැලපීම යන කරුණු සිසුන්ට අවබෝධවන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

(ආ) (1) කොටසේ පහසුතාව 77%කි. පොදු කාර්ය පිරිවැය නිවැරදි පදනම් මත පිරිවැය මධ්‍යස්ථාන අතර විභාජනය කිරීම පිළිබඳ අවබෝධය සමහර සිසුනට නොතිබිණි.

(2) වන කොටසේ පහසුතාව 44%කි. නිෂ්පාදන මධ්‍යස්ථානවල පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(3) වන කොටසේ පහසුතාව 35%කි. A හා B භාණ්ඩ සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමට, පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කර නොතිබීම, ගණනය කරන ලද අන්තර්ග්‍රහන අනුපාතය නිවැරදිව පැය ගණනට අනුකූලව ප්‍රාථමික පිරිවැයට එකතු කර නොතිබීම යන දුර්වලතා දක්නට තිබුණි.

භාණ්ඩ ඒකකයක නිෂ්පාදන පිරිවැයට, ප්‍රාථමික පිරිවැයත්, පොදු කාර්ය පිරිවැයත් යන කොටස් 2කම එකතු කළ යුතු බැවින් ඒ සඳහා පොදු කාර්ය පිරිවැය මධ්‍යස්ථාන අතර නිවැරදිව විභාජනය, නැවත විභාජනය, අන්තර්ග්‍රහණ අනුපාත සැකසීම, අනුපාත ඔස්සේ අන්තර්ග්‍රහණය අවබෝධය තහවුරු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

03 ප්‍රශ්නය

3. 2013.01.01 දින සුනිමල් වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2013 ජනවාරි මාසය තුළ දී ව්‍යාපාරයේ ගනුදෙනු පහත පරිදි වේ.

අංකය	දිනය	ගනුදෙනුව
(i)	2013.01.01	සුනිමල් විසින් රු. 400000 ක මුදලක් සහ රු. 840000 ක් වටිනා වෑන් රථයක් ව්‍යාපාරයේ ආයෝජනය කරන ලදී.
(ii)	2013.01.01	රු. 240000 ක් වටිනා ලී බඩු සහ සවිකිරීම් මිල දී ගන්නා ලදී.
(iii)	2013.01.08	රු. 100000 ක් වටිනා භාණ්ඩ මිල දී ගන්නා ලද අතර මුළු වටිනාකමට වෙක්පතක් නිකුත් කරන ලදී.
(iv)	2013.01.12	රු. 80000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 130000 කට විකුණන ලද අතර මෙම වටිනාකම සඳහා වෙක්පතක් ලැබුණි.
(v)	2013.01.15	රු. 150000 ක් වටිනා භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී.
(vi)	2013.01.20	රු. 140000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 200000 කට ණයට විකුණන ලදී.
(vii)	2013.01.23	ණයහිමියන්ට ගෙවිය යුතු වටිනාකමෙන් කොටසක් පියවීමට රු. 90000 ක වෙක්පත් නිකුත් කරන ලද අතර රු. 5000 ක වට්ටමක් ලැබුණි.
(viii)	2013.01.25	රු. 90000 ක මෙහෙයුම් වියදම් ගෙවන ලදී.
(ix)	2013.01.26	ණයගැතියන්ගෙන් රු. 150000 ක් ලද අතර එම මුදල බැංකුවේ තැන්පත් කරන ලදී.

අතිරේක තොරතුරු :

(i) ව්‍යාපාරයේ සියලුම මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබේ.

(ii) 2013.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට මුදල් පොතේ ශේෂය සමඟ පහත සඳහන් කරුණු හේතුවෙන් එකඟ නොවීය.

(අ) ණයගැතියකු විසින් බැංකුවේ සෘජුව ම තැන්පත් කළ රු. 30000 ක වෙක්පතක් මුදල් පොතේ සටහන් වී නොමැත.

(ආ) රු. 2000 ක් වූ බැංකු ගාස්තු මුදල් පොතේ සටහන් වී නොමැත.

(ඉ) ණයහිමියන්ට නිකුත් කරන ලද වෙක්පත් අතුරෙන් රු. 20000 ක වෙක්පතක් ගෙවීමට ඉදිරිපත් කර නොමැත.

(iii) දේපල, පිරියත සහ උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) මාසය අවසානයේ ණයගැති ශේෂය මත 10% ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කළ යුතුය.

අවශ්‍යවන්නේ:

(1) ඉහත අංක (i) සිට (ix) දක්වා ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද අඩු වේ නම් (–) ද යන්න සඳහන් කිරීම. (පහත ආකෘතිය භාවිත කරන්න.)

ගනුදෙනු අංකය	වත්කම්					වගකීම්	හිමිකම්
	මෝටර් රථය	ලී බඩු සහ සවිකිරීම්	තොගය	ණය ගැතියෝ	බැංකු		

(2) ඉහත බැංකු තීරුවේ ශේෂය භාවිත කරමින්, 2013.01.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පොතේ සංශෝධිත ශේෂය ගණනය කිරීම

(3) 2013.01.31 දිනෙන් අවසන් මාසය සඳහා සුනිමල්ගේ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය

(ලකුණු 15 යි)

ප්‍රශ්න අංක 03 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(3) (1)

(රු'000)

	වත්කම්					වගකීම්	හිමිකම්	
	මෝටර් රථ	ලී බඩු	තොගය	ණයගැතියෝ	බැංකු			
(i)	+ 840				+ 400		+ 1 240	(02)
(ii)		+ 240			- 240			(01)
(iii)			+ 100		- 100			(01)
(iv)			- 80		+130		+ 50	(02)
(v)			+ 150			+ 150		(01)
(vi)			- 140	+ 200			+ 60	(02)
(vii)					- 90	- 95	+ 05	(02)
(viii)					- 90		- 90	(01)
(ix)				- 150	+ 150			(01)
	840	240	30	50	160	55	1 265	

(ලකුණු 13)

(2) 2013.01.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු 208 000 (02)

පෙරවැඩ

බැංකු ප්‍රකාශනයේ ශේෂය	රු'000	
සංශෝධිත බැංකු ශේෂය	(01) 188	
එකතු කළා :		
ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්	20	(01)
2013.01.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය	208	

(3) මුදල් පොතේ සංශෝධිත ශේෂය රු 188 000 (03) ← පෙර වැඩ බලන්න

පෙර වැඩ බලන්න ↓

බැංකු ගිණුම			රු '000'	
ශේෂය ඉ/ගෙ	(01) 160	බැංකු ගාස්තු	2	(01)
සෘජු ප්‍රේෂන	30	(01) ශේෂය ප/ගෙ	188	
	190		190	
ශේෂය ඉ/ගෙ	188			

(ලකුණු 05)

(3) සුනිමල්ගේ ව්‍යාපාරය

2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

රු '000

විකුණුම් (130+200)		330 (02)
විකුණුම් පිරිවැය		
ගැනුම් (100+150)	250	
අවසාන තොගය	(30)	(220) (02)
දළ ලාභය		110
වෙනත් ආදායම්		
ලද වට්ටම්		5 (01)
		115
වියදම්		
ලීබඩු ක්ෂය	2 (01)	
වැන්රථ ක්ෂය	7 (01)	
අඩමාන ණය	2 (02)	
මෙහෙයුම් වියදම්	90 (01)	
බැංකු ගාස්තු	2 (01)	(103)
මාසයේ ලාභය		(01) 12

(ලකුණු 12)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.

3 වන ප්‍රශ්නය අයදුම්කරුවන්ගෙන් 91%ක් පමණ තෝරා ගෙන ඇත.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 27%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 27%ක් වන අතර ලකුණු 7 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 17%කි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 3 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (1) වන අතර එහි පහසුතාව 77%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස (3) වන අතර එහි පහසුතාව 44% කි.

(3) (1) කොටසේ පහසුතාව 77%කි. ණය හිමියන්ට මුදල් ගෙවීමේදී ලැබූ වට්ටම, වගකීම් අඩුවීමක් ලෙස සමහර අයදුම්කරුවන් හඳුනා ගෙන නොතිබුණි.

(2) වන කොටසේ පහසුතාව 73%කි. අතිරේක තොරතුරු භාවිත කරමින් බැංකු ශේෂය සංශෝධනය කර ගැනීමට නොහැකිව තිබුණි.

(3) වන කොටසේ පහසුතාව 44%කි. ගිණුම්කරණ සමීකරණ දත්ත හා අතිරේක තොරතුරු ඇසුරෙන් ආදායම් ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කිරීමට බොහෝ සිසුනට අපහසු වී තිබුණි.

ගැළපුම් සටහන් සමගින් ගිණුම්කරණ සමීකරණ පිළියෙල කිරීමත්, සමීකරණ දත්ත ඇසුරෙන් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමත් නිවැරදිව අවබෝධ වනසේ අභ්‍යාස කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

04 ප්‍රශ්නය

4. (අ) රොෂාන් විසින් ඔහුගේ සුඛෝපභෝගී මෝටර් රථය යොදා ගනිමින් විවාහ මංගල උත්සව සඳහා රථවාහන කුලියට දීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරයි. මෝටර් රථය සඳහා ඇස්තමේන්තු වියදම් පහත පරිදි වේ.

වාර්ෂික රක්ෂණය	- රු. 58000
වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු	- රු. 8000
මාසික පිලිසකර කිරීම් සහ නඩත්තු ගාස්තු	- රු. 5000
වාර්ෂික ක්ෂය	- රු. 500000
රියදුරුගේ වැටුප	- මසකට රු. 9000 ක් සහ කුලී ආදයමෙන් 10% කි.
පෙට්‍රල් වියදම	- කිලෝමීටරයකට රු. 20 කි.

පහත සඳහන් දෑ ද ඇස්තමේන්තු කර ඇත.

වාර්ෂික පරිපාලන වියදම්	- රු. 50000
මෝටර්රථ කුලී ආදයම	- කිලෝමීටරයකට රු. 100 කි.

අවශ්‍යවන්නේ:

(1) ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැය ආවරණය කිරීමට ධාවනය කළ යුතු කිලෝමීටර ගණන

(2) වර්ෂයක් තුළ දී ව්‍යාපාරය රු. 350000 ක ලාභයක් අපේක්ෂා කරන්නේ නම් ධාවනය කළ යුතු කිලෝමීටර ගණන

(ලකුණු 05 යි)

(ආ) උදර ක්‍රීඩා සමාජය සාමාජිකයන්ගේ භාවිතය සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සහ පිහිනුම් තටාකයක් පවත්වා ගෙන යයි. 2013.03.31 සහ 2012.03.31 දිනට එහි වත්කම් සහ වගකීම් පහත පරිදි වේ.

	2013.03.31 දිනට (රු. '000)	2012.03.31 දිනට (රු. '000)
ගොඩනැගිලි (ධාරණ වටිනාකමට)	2000	2400
පිහිනුම් තටාකය (ධාරණ වටිනාකමට)	3750	4000
කලින් ලද පිහිනුම් තටාක කුලී	50	60
ලැබිය යුතු සාමාජික මුදල්	90	80
ස්ථාවර තැන්පතුව	1200	-
මුදල්	?	100

2013.03.31 දිනෙන් අවසන් වර්ෂයට පහත තොරතුරු අදළ වේ.

(i) පහත දී ඇති සියලු වියදම් මුදලින් ගෙවා ඇත.

	රු. '000
පිහිනුම් තටාක භාරකරුගේ වාර්ෂික වැටුප	300
අනෙකුත් සේවකයන්ගේ වාර්ෂික වැටුප්	1200
අනිකුත් වියදම්	300

(ii) පිහිනුම් තටාකය බාහිර ආයතනවලට ද කුලියට දෙනු ලැබේ. ප්‍රවර්තන වර්ෂය තුළ දී අයකළ ගාස්තු සහ කුලියට දුන් දින ගණන පහත පරිදි වේ.

ගාස්තුව (රු.)	කුලියට දුන් දින ගණන
දිනකට රු. 50000	30
දින භාගයකට රු. 25000	20

(iii) සාමාජිකයකුගේ මාසික සාමාජික මුදල රු. 1000 කි. 2012.04.01 දින සාමාජිකයන් 100 දෙනකු සිටි අතර එදින නව සාමාජිකයන් 10 දෙනකු ක්‍රීඩා සමාජයට බැඳුණි. නව සාමාජිකයන් විසින් වර්ෂය සඳහා මුළු සාමාජික මුදල ගෙවන ලදී. ආරම්භක සාමාජිකයින්ගෙන් 15 දෙනකු 2012.09.30 දින ඉවත් වූ අතර එදින දක්වා ඔවුන් විසින් ගෙවිය යුතු සාමාජික මුදල් නිසි පරිදි ගෙවා තිබුණි. 2012.03.31 දිනට හිඟව තිබූ මුළු සාමාජික මුදල ප්‍රවර්තන වර්ෂය තුළ දී ලැබුණි.

(iv) ක්‍රීඩා සමාජයේ ආපනශාලාව බාහිර ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන අතර එහි ආදායමෙන් 20% ක් ක්‍රීඩා සමාජයට ගෙවිය යුතු වේ. වර්ෂය තුළ දී ආපනශාලාවේ ආදායම රු. 300000 ක් වූ අතර ක්‍රීඩා සමාජයට ගෙවිය යුතු මුදල නිසි පරිදි ලැබී ඇත.

(v) 2012.12.01 දින 10% ක වාර්ෂික පොලියකට වසරක කාලයක් සඳහා ස්ථාවර තැන්පත් ගිණුම ආරම්භ කරන ලදී.

(vi) වර්ෂය තුළ දී දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් හෝ ඉවත් කිරීම් සිදු වී නොමැත.

අවශ්‍යවන්නේ:

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

(2) 2013.03.31 දිනට සමුච්චිත අරමුදල සහ මුදල් ශේෂය

(ලකුණු 10 යි)
(මුළු ලකුණු 15 යි)

ප්‍රශ්න අංක 04 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (අ) (1) කි.මී. 11 200 (07)

පෙරවැඩ : ධාවනය කළයුතු කි.මී. = 784 000 (04) / 70 (03) → පෙර වැඩ බලන්න. = කි.මී. 11 200	
	රු.
රක්ෂණ	58 000
ආදායම් බලපත්‍ර ගාස්තු	8 000
පිළිසකර හා නඩත්තු	60 000
ක්ෂය	500 000 [03]
පරිපාලන	50 000
වැටුප්	108 000
මුළු ස්ථාවර පිරිවැය	784 000
විචල්‍ය පිරිවැය :	රු
රියදුරු වටුප්	10 [01]
ඉන්ධන	20 [01]
	30
දායකය (රු) = 100 [01] - 30	
= 70	

(ලකුණු 07)

(2) කි.මී. 16 200 (03)

පෙරවැඩ : (01) 784 000 + 350 000 (01) / (01) 70 = කි.මී.16 200

(ලකුණු 03)

(ආ) (1)

උදාර ක්‍රීඩා සමාජය
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් හා වියදම් ගිණුම

(රු000)

පිහිනුම් තටාක සේවක වැටුප්	300		පිහිනුම් තටාක ආදායම්	2 000 (01)	
අනෙකුත් සේවක වැටුප්	1 200 (01)		ආපන ශාලා ආදායම්	60 (01)	
අනෙකුත් වියදම්	300		පොලී ආදායම්	40 (01)	
ගොඩනැගිලි ක්ෂය	400 (01)		සාමාජික ගාස්තු	1 230 (03)	← පෙර වැඩ බලන්න.
පිහිනුම් තටාක ක්ෂය	250 (01)				
අතිරික්තය (01) – ලද අගයට	880				
	3 330			3 330	

(ලකුණු 10)

පෙර වැඩ :

සාමාජික ගාස්තු		රු'000	
10 x 12	=	120	(01)
15 x 6	=	90	(01)
85 x 12	=	1 020	(01)
		1 230	

පිහිනුම් තටාක ආදායම		රු'000	
30 x 50	=	1 500	(01)
20 x 25	=	500	
		2 000	

(2) මුදල් ශේෂය රු 370 000 (07)

පෙරවැඩ : රු'000

ලැබීම් සහ ගෙවීම් ගිණුම

ශේෂය ඉ/ගෙ	100	පිහිනුම් තටාක වැටුප්	300
සාමාජික මුදල්	1 220 (02)	අනෙකුත් වැටුප්	1 200 (01)
පිහිනුම් තටාක ආදායම	1 990 (02)	වෙනත් වියදම්	300
ආපන ශාලා ආදායම	60 (01)	ස්ථාවර තැන්පත්	1 200 (01)
		ශේෂය ප/ගෙ	370
	3 370		3 370

සාමාජික මුදල් ගිණුම

ශේෂය ඉ/ගෙ	80	මුදල්	1 220
ආදායම් හා වියදම්	1 230	ශේෂය ප/ගෙ	90
	1 310		1 310

(අයිතම 2කට 1 බැගින් ලකුණු 02 යි)

පිහිනුම් තටාක ආදායම් ගිණුම

ආදායම් හා වියදම්	2 000	ඉ/ගෙ ශේෂය	60
ශේෂය ප/ගෙ	50	මුදල්	1 990
	2 050		2 050

(අයිතම 2කට 1 බැගින් ලකුණු 02 යි)

2013.03.31 දිනට සමුච්චිත අරමුදල රු 7 400 000 (03)

පෙරවැඩ :	(රු'000)	
ගොඩනැගිලි	2 400	(02)
පිහිනුම් තටාකය	4 000	
ලැබිය යුතු සාමාජික මුදල්	80	
මුදල්	100	
කලින් ලද පිහිනුම් තටාක කුලී	(60)	
2012.03.31 දිනට සමුච්චිත අරමුදල	6 520	
වර්ෂයේ අතිරික්තය	880	(01)
2013.03.31 දිනට සමුච්චිත අරමුදල	7 400	

විකල්පය :	(රු'000)
ගොඩනැගිලි	2 000
පිහිනුම් තටාකය	3 750
ලැබිය යුතු සාමාජික මුදල්	90
ස්ථාවර තැන්පත්	1 200
මුදල්	370
ලැබිය යුතු පොලී	40
කලින් ලද පිහිනුම් තටාක කුලී	(50)
2013.03.31 දිනට සමුච්චිත අරමුදල	7 400

(ඕනෑම අයිතම 2කට 1 බැගින් ලකුණු (03) යි.)

(ලකුණු 09)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30 කි.
4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 62%ක් පමණි.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 52%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩි ලකුණු ලබාගත් පිරිස 6%ක් පමණක් වන අතර අයදුම්කරුවන්ගෙන් 52%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 7 හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 4න් කොටස් 2ක පහසුතාව 40%ට වඩා ඉහළ ය. පහසුතාව අඩුම අනුකොටස (ආ) (2) වන අතර එහි පහසුතාව 28%ක් වේ. පහසුතාව වැඩිම අනුකොටස (අ) (2) වේ. එහි පහසුතාව 50% කි.

(4) (අ) (1) කොටසේ පහසුතාව 42%කි. ස්ථාවර හා විචල්‍ය පිරිවැය පැහැදිලිව හඳුනා ගැනීමට බොහෝ සිසුනට අපහසු වී තිබුණි. (අ) (2) කොටසේ පහසුතාව 50%කි. අපේක්ෂිත ලාභයක් ලබාගැනීමට ධාවනය කළ යුතු කිලෝ මීටර ගණන ගණනය කිරීමට සමහර සිසුනට නොහැකිව තිබුණි. (ආ) (1) කොටසේ පහසුතාව 34%කි. සාමාජික මුදල් නිවැරදිව ගණනය කිරීමට නොහැකිවීම, පිහිනුම් තටාක ආදායම නිවැරදිව ගණනය කිරීමට නොහැකිවීම මෙහි පහසුතාව අඩුවීමට හේතුවිය හැකිය. (ආ) (2) කොටසේ පහසුතාව 28%කි. කලින් ලද පිහිනුම් තටාක කුලී වගකීමක් ලෙස හඳුනාගෙන නොතිබීම හා වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල ගණනය සඳහා වසරේ අතිරික්තය එකතු කළ යුතු බව අවබෝධ කරගෙන නොතිබීම මෙම කොටසේ පහසුතාව අඩුවීමට හේතුවිය හැකිය.

වර්ෂය අවසානයේ සමුච්චිත අරමුදල ගණනය සඳහා වසරේ අතිරික්තය එකතු කළයුතු බව අවබෝධ කරගෙන නොතිබීම. වසර අග මුදල් ශේෂය සෙවීම සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම නිවැරදිව පිළියෙල කර නොතිබීම. එහිදී පිහිනුම් තටාකයෙන් මුදලින් ලැබූ ආදායම හා සාමාජිකයන්ගෙන් මුදලින් ලද ආදායම නිවැරදිව ගණනය කර නොතිබීම හේතුවෙන් මෙම ප්‍රශ්නය සඳහා පහසුතාව අඩුවී ඇත. ස්ථාවර හා විචල්‍ය පිරිවැය හඳුනා ගැනීමට හැකිවන පරිදි ප්‍රායෝගික අවස්ථාවක් යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. ලාභ අරමුණු කර නොගත් සංවිධානවල පවතින බාහිර ක්‍රියාකාරකම් නිදසුන් ලෙස යොදා ගනිමින් වර්ෂය තුළදී ලැබූ මුදල් ප්‍රමාණයත්, වර්ෂයට අදාළ ආදායම් ප්‍රමාණයත් පැහැදිලි වනසේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

05 ප්‍රශ්නය

5. (අ) 2013 මාර්තු සහ පෙබරවාරි මාස සඳහා සීමිත අබ්දුල් පොදු සමාගමේ වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	2013 මාර්තු (රු. '000)	2013 පෙබරවාරි (රු. '000)
මූලික වැටුප	8000	7000
අතිකාල දීමනා	500	400
සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය:		
– සේවකයා (10%)	800	700
– සේව්‍යයා (15%)	1200	1050
සේවක භාරකාර අරමුදලට (ETF) දායකත්වය (3%)	240	210
අඩු කිරීම්:		
– වෘත්තීය සමිතියේ සාමාජික ගාස්තු	250	150
– සේවක ණය ආපසු අය කිරීම්	450	200

අතිරේක තොරතුරු :

(i) සෑම මසකම වැටුප ඊළඟ මාසයේ 10 වන දින ගෙවනු ලැබේ.

(ii) සෑම මසකම සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් දායකයන් ඊළඟ මාසයේ 15 වන දින ගෙවනු ලැබේ.

අවශ්‍යවන්නේ:

(1) 2013 මාර්තු මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුළු වියදම (එක් එක් අයිතමයන් වෙන වෙන ම දක්වන්න.)

(2) 2013 මාර්තු මාසය සඳහා සමාගමේ වැටුප් පාලන ගිණුම, ගෙවිය යුතු වැටුප් ගිණුම සහ ගෙවිය යුතු EPF ගිණුම (ආරම්භක ශේෂයන් ද සහිත ව)

(ආ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මධුර පොදු සමාගමේ සහ සීමිත සුමුදු පොදු සමාගමේ සාරාංශගත ආදයම් ප්‍රකාශන පහත දී ඇත.

	සීමිත මධුර පොදු සමාගම (රු. '000)	සීමිත සුමුදු පොදු සමාගම (රු. '000)
විකුණුම්	6000	7 500
විකුණුම් පිරිවැය	(4000)	(5800)
දළ ලාභය	2000	1700
වියදම්	(1100)	(800)
බදු පෙර ලාභය	900	900
ආදයම් බදු	(300)	(300)
වර්ෂය සඳහා ලාභය	**600**	**600**

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ද දී ඇත.

	සීමිත මධුර පොදු සමාගම (රු. '000)	සීමිත සුමුදු පොදු සමාගම (රු. '000)
සාමාන්‍ය තොගය	1600	2900
සාමාන්‍ය වෙළෙඳ ණයගැතියෝ	2400	2500
2013.03.31 දිනට හිමිකම	3000	2400
2013.03.31 දිනට දිගුකාලීන ණය	3600	1800
වියදම් තුළ ඇතුළත් ණය පොලී	300	200

අවශ්‍යවන්නේ:

(1) සමාගම් දෙක සඳහා පහත දැක්වෙන අනුපාත:

(i) හිමිකම් මත ඉපැයුම්

(ii) පොලී ආවරණ

(iii) තොග පිරිවැටුම්

(iv) ණයගැති පිරිවැටුම් (සියලු ම විකුණුම් ණයට් කළ බව උපකල්පනය කරන්න.)

(v) ණය හිමිකම්

(2) ඉහත (1) හි කරන ලද ගණනය කිරීම් පදනම්ව, පහත දැ හේතු සහිතව සඳහන් කරන්න.

(i) අයිතිකරුවන් සඳහා වැඩි ඉපැයුමක් ජනනය කරන සමාගම

(ii) වැඩිපුර ණය ප්‍රාග්ධනය භාවිත කරන සමාගම

(iii) ණයගැතියන්ගෙන් මුදල් එකතු කිරීමට වැඩිපුර කාලයක් ගත කරනු ලබන සමාගම

(iv) තොග විකිණීම සඳහා අඩු කාලයක් ගත කරනු ලබන සමාගම

(v) ණය මත පොලී ගෙවීමට වැඩි හැකියාවක් ඇති සමාගම

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

ප්‍රශ්න අංක 05 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

05. (අ) (1) 2013 - මාර්තු මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුළු වියදම :-

		රු'000	
මූලික වැටුප	-	8 000	(01)
අතිකාල දීමනා	-	500	
සේවක අර්ථ සාධක අරමුදල	-	1 200	(01)
සේවක භාරකාර අරමුදල	-	240	(01)
සේවකයින් සඳහා මුළු වියදම	-	9 940	

(ලකුණු 03)

(2)

වැටුප් පාලන ගිණුම			රු'000
ගෙවිය යුතු EPF	300	වැටුප් වියදම්	8 500
වෘත්තීය සමිති ගාස්තු	250		
සේවක ණය	450		
ගෙවිය යුතු වැටුප්	7 000		
	8 500		8 500

ගෙවිය යුතු වැටුප් ගිණුම			රු'000
මුදල්	6 350	ශේෂය ඉ/ගෙ	6 350
ශේෂය ප/ගෙ	7 000	වැටුප් පාලන	7 000
	13 350		13 350

ගෙවිය යුතු EPF ගිණුම			රු'000
මුදල්	1 750	ශේෂය ඉ/ගෙ	1 750
ශේෂය ප/ගෙ	2 000	වැටුප් පාලන	800
		EPF වියදම්	1 200
	3 750		3 750

(අයිතම 02කට ලකුණු 01 බැගින් ලකුණු 07)
(ලකුණු 07)

(ආ) (1)

	සීමිත මධුර පොදු සමාගම	සීමිත සුමුදු පොදු සමාගම
(i) හිමිකම් මත ඉපයුම :- $\frac{\text{වර්ෂය සඳහා ලාභය}}{\text{හිමිකම}} \times 100$	$\frac{600\,000}{3\,000\,000} \times 100$ 20% (01)	$\frac{600\,000}{2\,400\,000} \times 100$ 25% (01)
(ii) පොලී ආවරණ අනුපාතය :- $\frac{\text{බදු පෙර ලාභය + ණය පොලී}}{\text{ණය පොලී}}$	$\frac{900\,000 + 300\,000}{300\,000}$ වාර - 4 (01)	$\frac{900\,000 + 200\,000}{200\,000}$ වාර - 5.5 (01)
(iii) තොග පිරිවැටුම් අනුපාතය :- $\frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$	$\frac{4\,000\,000}{1\,600\,000}$ වාර - 2.5 (01)	$\frac{5\,800\,000}{2\,900\,000}$ වාර - 2 (01)
(iv) ණයගැති පිරිවැටුම් අනුපාතය:- $\frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$	$\frac{6\,000\,000}{2\,400\,000}$ වාර - 2.5 (01)	$\frac{7\,500\,000}{2\,500\,000}$ වාර - 3 (01)
(v) ණය හිමිකම් අනුපාතය :- $\frac{\text{දිගු කාලීන ණය}}{\text{හිමිකම}}$	$\frac{3\,600\,000}{3\,000\,000}$ 1.2 : 1 1.2/120% (01)	$\frac{1\,800\,000}{2\,400\,000}$ 0.75% 0.75/75% (01)

(ලකුණු 10)

(2)

සමාගම	හේතුව
(i) සීමිත සුමුදු පොදු සමාගම (01)	ඉහළ හිමිකම් මත ඉපැයුම් අනුපාතයක් පැවැතීම. (01)
(ii) සීමිත මධුර පොදු සමාගම (01)	ඉහළ ණය හිමිකම් අනුපාතයක් පැවතීම. (01)
(iii) සීමිත මධුර පොදු සමාගම (01)	පහළ ණයගැති පිරිවැටුම් අනුපාතයක් පැවතීම. (01)
(iv) සීමිත මධුර පොදු සමාගම (01)	ඉහළ තොග පිරිවැටුම් අනුපාතයක් පැවතීම. (01)
(v) සීමිත සුමුදු පොදු සමාගම (01)	ඉහළ පොලී ආවරණ අනුපාතයක් පැවතීම. (01)

(ලකුණු 10)

5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 65%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 30ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 14%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 38%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනු කොටස් 12න් කොටස් 5ක පහසුතාව 60% වඩා ඉහළය.
ඉහළම පහසුතාව (ආ) (1) (iv) 74%කි. අඩුම පහසුතාව (අ) (2) 30% ක්ද, (ආ) (2) (iv) 38%ක්ද වේ.

(5) (අ) (1) පහසුතාව 65%කි. සමාගමේ සේවකයින්ට අදාළ මුළු වියදම ගණනය කිරීම සඳහා සමාගමේ සේවක අර්ථසාධක අරමුදල් දායකයත්, සේවා නියුක්ති භාරකාර අරමුදල් දායකයත් එකතු කළ යුතු බව සමහර සිසුන් අවබෝධ කරගෙන නොතිබුණි.

(අ) (2) පහසුතාව 38%කි. වැටුප් පිරිවැයට අදාළ තොරතුරු නිවැරදිව ගිණුම්ගත කිරීමට බොහෝ සිසුනට අපහසු වී තිබුණි.

සේවකයින්ගේ වැටුපට අදාළව ඉපයීම් සහ අඩුකිරීම් ප්‍රායෝගිකව, වැටුප් ලේඛන ඇසුරෙන් පැහැදිළිව අවබෝධ කිරීමත් එම තොරතුරු ගිණුම්ගත වනුයේ කෙසේද යන්න පිළිබඳවත් නිවැරදිව අවබෝධ වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

(ආ) 1 හි කොටස් 5 සඳහා ම 50%කට වැඩි පහසුතාවක් ඇත. (ආ) 2 හි iii හා iv හි පහසුතාව පිළිවෙළින් 40% හා 38% වේ. තොග පිරිවැටුම් අනුපාතය තුළින්, තොග විකිණීමට ගතවන කාලය හඳුනාගැනීමත්, ණයගැති පිරිවැටුම් අනුපාතය තුළින්, ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීමට ගතවන කාලයත් නිගමනය කළ හැකි බව පිළිබඳව සිසුනට අවබෝධයක් නොතිබුණි.

අනුපාත අතර සම්බන්ධතාවයක් ඇතිවන ආකාරය පැහැදිලි වන ලෙසත් ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශ ඇසුරින් අනුපාත ගණනය කිරීම හා ව්‍යාපාර සංසන්දනය පිළිබඳ ව මනා අවබෝධයක් ඇතිවන ආකාරයටත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

06 ප්‍රශ්නය

6. **(අ)** 2012.03.31 දිනට සීමිත නාදන් පොදු සමාගමේ දේපල, පිරියත සහ උපකරණ සඳහා පහත තොරතුරු අඳළ වේ.

වත්කම	පිරිවැය (රු. '000)	ධාරණ වටිනාකම (රු. '000)	සුන්බුන් අගය (රු. '000)	ඵලදායී ජීව කාලය (වසර)
ඉඩම්	3500	3000	-	-
ගොඩනැගිල්ල	2500	1000	-	25
මෝටර් රථය	5000	3200	500	5
කාර්යාල උපකරණ	500	400	100	4

මෙදිනට සමාගම සතු වූයේ එක ම මෝටර් රථයකි. වත්කම් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ඉඩම් ප්‍රත්‍යාගණන අලාභය රු. 500000 ක් විය.

2013.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී මෙම වත්කම්වලට අදළව පහත ගනුදෙනු සිදු විය.

දිනය	ගනුදෙනුව
2012.04.01	රු. 1250000 ක් වැය කරමින් ගොඩනැගිල්ල පුළුල් කරන ලදී. එම නිසා ගොඩනැගිල්ලේ ඉතිරි ඵලදායී ජීවකාලය වසර 10 සිට 15 ක් දක්වා වැඩි වී ඇත.
2012.10.01	මෝටර් රථය රු. 3000000 කට විකුණන ලද අතර නව මෝටර් රථයක් රු. 4000000 කට මිල දී ගන්නා ලදී. නව මෝටර් රථයේ අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 6 ක් වන අතර සුන්බුන් අගය රු. 400000 කි.
2013.01.01	කාර්යාලීය උපකරණ අළුත්වැඩියා කිරීමට රු. 50000 ක් වැය කරන ලදී.
2013.03.31	ඉඩම රු. 4000000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

ඉහත ගනුදෙනු ගැලපීමට පෙර 2013.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකම රු. 1000000 ක් විය.

අවශ්‍යවන්නේ:

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එක් එක් දේපල, පිරියත සහ උපකරණ අයිතමය මත ක්ෂය ගණනය කිරීම

(2) ඉහත ගනුදෙනු ගැලපීමෙන් පසු 2013.03.31 දිනට සමාගමේ හිමිකම ගණනය කිරීම

(ආ) සීමිත කුමුදු පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය ප්‍රකාශන පහත දී ඇත.

සීමිත කුමුදු පොදු සමාගම

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

	රු. '000	රු. '000
විකුණුම්		7200
විකුණුම් පිරිවැය		(4200)
දළ ලාභය		3000
ඉඩම් විකිණීමේ ලාභය		300
ක්ෂය - ගොඩනැගිලි	500	
- කාර්යාල උපකරණ	800	
අනෙකුත් වියදම්	1000	(2300)
බදු පෙර ලාභය		1000
ආදායම් බදු		(300)
වර්ෂය සඳහා ලාභය		**700**

සීමිත කුමුදු පොදු සමාගම

මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය)

	2013 (රු. '000)	2012 (රු. '000)
ඉඩම්	5000	9000
ගොඩනැගිලි - පිටිවැයට	10000	10000
සමුච්චිත ක්ෂය - ගොඩනැගිලි	(5000)	(4500)
කාර්යාලීය උපකරණ - පිරිවැයට	8000	4000
සමුච්චිත ක්ෂය - කාර්යාලීය උපකරණ	(2400)	(1600)
තොගය	1400	1000
වෙළෙඳ ණයගැතියෝ	1500	1200
බැංකුවේ ඇති මුදල්	1500	500
	20000	**19600**
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	14000	13000
රඳවාගත් ඉපැයුම්	4200	4000
වෙළෙඳ ණයහිමියෝ	1500	2000
ගෙවිය යුතු ආදයම් බදු	300	600
	20000	**19600**

අතිරේක තොරතුරු :

(i) පියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත වේ.

(ii) සමාගම 2012.04.01 දින සාමාන්‍ය කොටස් 10000 ක් රු. 1000000 කට නිකුත් කර ඇත.

(iii) ඉඩමෙන් කොටසක් රු. 4300000 කට අත්පිට මුදලට විකුණා ඇත.

(iv) 2013.03.31 දින රු. 4000000 ක් වූ කාර්යාල උපකරණ අත්පිට මුදලට මිල දී ගෙන ඇත.

(v) වර්ෂය තුළදී රු. 500000 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

අවශ්‍යවන්නේ:

අදළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත කුමුදු පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

ප්‍රශ්න අංක 06 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(අ) (1)

ගොඩනැගිලි ක්ෂය = රු 150 000 (02)

පෙර වැඩ
1 000 000 +1 250 000 (01)
15 (01)

මෝටර් රථ ක්ෂය = රු 750 000 (02)

පෙර වැඩ :

පැරණි මෝටර් රථයේ ක්ෂය = (5 000 000 - 500 000) x 1/2 / 5
= රු 450 000 (01)

නව මෝටර් රථයේ ක්ෂයවීම = (4 000 000 - 400 000) x 1/2 / 6
= රු 300 000 (01)

කාර්යාල උපකරණ ක්ෂය = රු 100 000 (01)

පෙර වැඩ
500 000 - 100 000 / 4

(ලකුණු 05)

(2)

2013.03.31 දිනට හිමිකම

	රු'000	රු'000
2013.03.31 දිනට හිමිකම (ගැලපුම්වලට පෙර)	1 000	
එකතු කළා :		
මෝටර් රථ විකුණුම් ලාභය	250 (02) ← පෙර වැඩ බලන්න	
ඉඩම් ප්‍රත්‍යාගණන ලාභය	1 000 (01)	1 250
		2 250

අඩුකලා

ක්ෂය - ගොඩනැගිලි	(01)	150
මෝටර් රථ		750
කාර්යාල උපකරණ		100
කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම්	50 (01)	(1 050)
2013.03.31 දිනට හිමිකම		1 200

(ලකුණු 05)

පෙරවැඩ : රු'000

මෝටර් රථ විකුණුම් ගිණුම

මෝටර් රථ	5 000	සමුච්චිත ක්ෂය	2 250
ලාභාලාභ	250	මුදල්	3 000
	5 250		5 250

(අයිතම 2කට 1 බැගින් ලකුණු 02 යි)

(ආ) සීමිත කුමුදු පොදු සමාගම

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

		රු'000
මෙහෙයුම් ක්‍රියාකාරකම්		
ණයගැතියන්ගෙන් ලැබීම්	6 900 (02)	
ණයහිමියන්ට ගෙවීම්	(5 100) (04)	
මෙහෙයුම් වියදම් ගෙවීම්	(1 000) (01)	
මෙහෙයුම් තුළින් ශුද්ධ මුදල් ප්‍රවාහය		800
ගෙවූ ආදායම් බදු		(600) (02)
මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය → අගයක් සහිත ලද අගයට (01)		200
ආයෝජන ක්‍රියාකාරකම්		
ඉඩම් විකිණීම	4 300 (01)	
කාර්යාල උපකරණ ගැණුම්	(4 000) (01)	
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය → අගයක් සහිත ලද අගයට (01)		300
මූල්‍ය ක්‍රියාකාරකම්		
කොටස් නිකුතුව	1 000 (01)	
ලාභාංශ ගෙවීම	(500) (01)	
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (01)	ලද අගයට	500
කාලච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (01)	ලද අගයට	1 000 (01)
2012.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ		500 (01)
2013.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ		1 500

පෙරවැඩ : රු'000

ණයගැති පාලන ගිණුම

ශේෂය ඉ/ගෙ	1 200	මුදල්	6 900 (01)
විකුණුම්	7 200 (01)	ශේෂය ප/ගෙ	1 500
	8 400		8 400

ගෙවිය යුතු ආදායම් බදු

මුදල්	600	ශේෂය ඉ/ගෙ	600 (01)
ශේෂය ප/ගෙ	300	ලාභාලාභ	300 (01)
	900		900

ණයහිමි පාලන ගිණුම

මුදල්	5 100	ශේෂය ඉ/ගෙ	2 000 (01)
ශේෂය ප/ගෙ	1 500 (01)	ගැනුම්	4 600 (02)
	6 600		6 600

ආරම්භක තොගය	1 000	[01]
ගැණුම්	4 600	
	5 600	
අවසාන තොගය	(1 400)	
විකුණුම් බඩුවල පිරිවැය	4 200	[01]

විකල්පය :

සීමිත කුමුදු පොදු සමාගම
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (01)

රු'000

මෙහෙයුම් ක්‍රියාකාරකම්		
බදු පෙර ලාභය		1 000 (01)
ගැලපීම්		
ඉඩම් විකිණීමේ ලාභය	(300) (02)	
ක්ෂයවීම්	1 300 (01)	1 000
කාරක ප්‍රාග්ධන ගැළපීමට පෙර මුදල් ප්‍රවාහය		2 000
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් :		
තොග වැඩිවීම	(400) (01)	
ණයගැතියෝ වැඩිවීම	(300) (01)	
ණයහිමියෝ අඩුවීම	(500) (01)	(1 200)
මෙහෙයුම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය		800
ගෙවූ ආදායම් බදු		(600) (02)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (01)		200
ආයෝජන ක්‍රියාකාරකම්		
ඉඩම් විකිණීමෙන්	4 300 (01)	
කාර්යාල උපකරණ ගැනුම්	(4 000) (01)	
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (01)		300
මූල්‍ය ක්‍රියාකාරකම්		
සාමාන්‍ය කොටස් නිකුත් කිරීම	1 000 (01)	
ලාභාංශ ගෙවීම	(500) (01)	
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (01)		500
කාලච්ඡේදයේ මුදල් හා මුදල් සමාන දෑ වන ශුද්ධ වැඩිවීම (01)		1 000
2012.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ		500 (01)
2013.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ		1 500 (01)

(ලකුණු 20)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 15 x 2 = ලකුණු 30කි.
6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 66%ක් පමණි.

ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 16%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24 හෝ ඊට වඩා ලකුණු ලබාගත් පිරිස 16%ක් පමණක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 32%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07 හෝ ඊට වඩා අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 3න් එක් කොටසක පහසුතාව 65%කි. පහසුතාව අඩුම අනුකොටස (අ) (2) වන අතර එහි පහසුතාව 19%ක් වේ.

(6) (අ) (1) කොටසෙහි පහසුතාව 39%කි. දේපල පිරියත හා උපකරණ සම්බන්ධ ක්ෂය ගණනය කිරීම පිළිබඳ ව සිසුන්ගේ අවබෝධය ඉතාම අඩු මට්ටමක පැවතුණි.

(අ) (2) කොටසෙහි පහසුතාව 19%කි. ආදායම් හා වියදම් සංශෝධනය තුළින් හිමිකමට ඇතිවන බලපෑම නිවැරදිව ගණනය කිරීමට බොහෝ සිසුනට නොහැකිවී තිබුණි.

දේපල පිරියත හා උපකරණවලට අදාළව වත්කම් ප්‍රත්‍යාගණනයන්, ඵලදායි ජීවිත කාලය වෙනස්වීම්, පසුකාලීන පිරිවැය දැරීම් යන ගැටළු සහිතව ක්ෂය ගැලපීම් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ඇතුළත් කළ යුතුය.

(ආ) කොටසෙහි පහසුතාව 65%කි. ණයගැති පාලන ගිණුම ඇසුරෙන් ගනුදෙනුකරුවන්ගෙන් මුදල් ලැබීමත්, විකුණුම් බඩුවල පිරිවැය ඇසුරෙන් ගැනුම් සොයා ගැනීමත්, ණයහිමි පාලන ගිණුම ඇසුරෙන් සැපයුම්කරුවනට මුදල් ගෙවීම් සොයා ගැනීම පිළිබඳ ව සමහර සිසුන්ට අවබෝධයක් නොතිබුණි. මෙම අවබෝධය ලැබෙන අයුරින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

07 ප්‍රශ්නය

7. (අ) 2013 ජූනි මාසය සඳහා නිෂ්පාදන සමාගමක ණයගැති ලෙජරයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී. (සියලුම වටිනාකම් රු.'000 වලින් දී ඇත.)

ණයගැතියා	2013.06.01 දිනට ශේෂය	විකුණුම්	මුදල් ලැබීම්	දුන් වට්ටම්	බොල් ණය	2013.06.30 දිනට ශේෂය
අජිත්	300	1400	1000	140	-	560
දයාන්	200	300	200	30	-	270
මලිත්ත	-	100	-	-	40	60
කමල්	100	100	-	-	20	180
	600	**1900**	**1200**	**170**	**60**	**1070**

2013.06.30 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය සහ ණයගැති ලෙජර් ශේෂවල එකතුව සමාන නොවීය. පසුව කරන ලද විමර්ශනවලින් පහත වැරදි හෙළිදරව් විය.

(i) මාසයේ විකුණුම් ණයගැති පාලන ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 1090000 ක් ලෙස ය. නමුත් එය නිවැරදිව විකුණුම් ගිණුමේ සටහන් කර ඇත.

(ii) යන්ත්‍රයක් රු. 600000 කට ණයට විකිණීම ණයගැති පාලන ගිණුමේ විකුණුම් ලෙස සටහන් කර ඇත.

(iii) මාසය තුළ දී කපා හල බොල්ණය ණයගැති පාලන ගිණුමේ සටහන් කර නොමැත. ඒ වෙනුවට ඒවා අවමාණ ණය සඳහා වෙන් කිරීමේ ගිණුමට බැර කර ඇත.

(iv) ණයගැතියන්ට දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමට හර කර ඇත. නමුත් එය දුන් වට්ටම් ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත.

අවශ්‍යවන්නේ:

(1) 2013.06.30 දිනට ණයගැති ලෙජරයේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂ සැසඳීමේ ප්‍රකාශනය

(2) ඉහත (i) සහ (iv) හි ඇති වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (සංලක්ෂ්‍යය අවශ්‍ය වේ.)

(ලකුණු 05 යි)

(ආ) සමාගමක් විසින් එහි නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මේ සම්බන්ධයෙන් පහත තොරතුරු ලබා දී ඇත.

(i) යන්ත්‍රයට අදළ තොරතුරු:

පිරිවැය	රු. 1000000
ඵලදායී ජීව කාලය	වසර 5 යි
සුන්බුන් අගය	රු. 100000
වාර්ෂික නඩත්තු පිරිවැය	රු. 50000

(ii) නව යන්ත්‍රය භාවිතයෙන් වාර්ෂිකව සෘජු ශ්‍රම පිරිවැයෙන් රු. 250000 ක් ඉතිරි කළ හැක.

(iii) නව යන්ත්‍රය මිල දී ගතහොත් පැරණි යන්ත්‍රය රු. 150000 කට විකිණිය හැක.

(iv) 10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක:

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍යවන්නේ:

ඉහත ව්‍යාපෘතියට අදළව:

(1) එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම්

(2) පිළිගෙවුම් කාලය

(3) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (ආරම්භක ආයෝජනය මත)

(4) ශුද්ධ වර්තමාන අගය

(5) ශුද්ධ වර්තමාන අගය පදනම්ව යන්ත්‍රය මිල දී ගැනීම සුදුසු දැයි යන නිර්දේශය

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 15 යි)

ප්‍රශ්න අංක 07 සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(අ) (1) ණයගැති ලෙජරයේ සහ ණයගැති පාලන ගිණුම්
ශේෂ සැසැඳීමේ ලේඛනය

(රු'000)

2013.06.30 ණයගැති ලෙජරයේ ශේෂය		1 070 (01)
එකතු කළා :		
යන්ත්‍ර විකුණුම්	600 (01)	
බොල් ණය	60 (01)	
දුන් වට්ටම්	340 (01)	1 000
		2 070
අඩුකළා :		
විකුණුම්	810 (01)	(810)
2013.06.30 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය		1 260 (01)

(ලකුණු 06)

(2) පොදු ජ'නලය (රු'000)

විස්තරය	හර	බර
ණයගැති පාලන ගිණුම	810	
අවිනිශ්චිත ගිණුම		810 (02)
(ණයගැති පාලන ගිණුමේ විකුණුම් අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරීම)		
අවිනිශ්චිත ගිණුම	340	
ණයගැති පාලන ගිණුම		340 (02)
(දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමේ හරට සටහන් කිරීම නිවැරදි කිරීම)		

(ලකුණු 04)

(ආ) (1) මුදල් ප්‍රවාහ (රු'000)

වර්ෂය / විස්තරය	0	1	2	3	4	5
මුදල් ගලා ඒම් :						
පැරණි යන්ත්‍රය විකිණීම	150 (01)			(02)		
ශ්‍රම පිරිවැය ඉතුරුම්	-	250	250	250	250	250
සුන්බුන් අගය	-	-	-	-	-	100 (02)
මුදල් ගලා යෑම් :						
යන්ත්‍රයේ පිරිවැය	(1000) (01)			(02)		
නඩත්තු පිරිවැය		(50)	(50)	(50)	(50)	(50)
	(850)	200	200	200	200	300

(ලකුණු 08)

(2) පිළිගෙවුම් කාලය = වර්ෂ 4 මාස 02 (03)

පෙරවැඩ (රු'000)

වර්ෂය	ශුද්ධ මුදල් ප්‍රවාහ	සමුච්චිත ශුද්ධ මුදල් ප්‍රවාහ
0	(850)	(850)
1	200	(650)
2	200	(450)
3	200	(250)
4	200	(50)
5	300	250

(3) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය = 4% / 4.7% / 5.8% (03)

පෙරවැඩ

= සාමාන්‍ය වාර්ෂික ලාභය / ආරම්භක ආයෝජනය

=	40	40	50
	1000	850	850
=	4%	4.7%	5.8%

(4) ශුද්ධ වර්තමාන අගය = රු (30 000) (04)

පෙරවැඩ (රු'000)

වර්ෂය	10% විටිටම් සාධකය	ශුද්ධ මුදල් ප්‍රවාහය	මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය
0	1	(850)	(850) (01)
1	0.91	200	182
2	0.83	200	166
3	0.75	200	150 (03) ලද අගයන්ට
4	0.68	200	136
5	0.62	300	186
		ශුද්ධ වර්තමාන අගය	(30)

(5) සුදුසු නොවේ. ශුද්ධ වර්තමාන අගය සෘණ අගයක් වීම. (02)

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය
15 x 2 = ලකුණු 30කි.
7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 68%ක් පමණි.

ඉන් ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ 46%ක් ද,
ලකුණු 08 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 16 - 23 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 24 - 30 ප්‍රාන්තරයේ 13%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 24ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් පිරිස 13%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 46%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 07ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් 7 අතුරින් කොටස් 3ක පහසුතාව 50%ට වැඩිය. (ආ) (3) කොටසෙහි පහසුතාව 8%කි.

(7) (අ) (1) කොටසෙහි පහසුතාව 41%කි. පාලන ගිණුමේ සිදුවී ඇති වැරදි සහ ණයගැති ලෙජර් ශේෂවල ඇති වූ වැරදි කවරේද යන්න හඳුනාගෙන නොතිබීමත්, සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී එහි බලපෑම ගළපන ආකාරය බොහෝ සිසුන් අවබෝධ කරගෙන නොතිබුණි.

(අ) (2) කොටසෙහි පහසුතාව 56%කි. පොදු ලෙජරයේ වැරදි නිවැරදි කිරීම පිළිබඳව සමහර සිසුනට අවබෝධයක් නොතිබුණි. පුද්ගල ලෙජර හා පොදු ලෙජර පිළිබඳ ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමේදී පොදු ලෙජරයේ පාලන ගිණුම පිළිබඳවත්, පුද්ගල ලෙජර තුළින් සකසන ශේෂ ලැයිස්තු පිළිබඳවත් සිසුනට නිවැරදි දැනුමක් ලබාදිය යුතුය.

(ආ) (1) කොටසෙහි පහසුතාව 53%ක් වන අතර (5) හි පහසුතාව 58%කි.

(ආ) (2) කොටසෙහි පහසුතාව 27%කි. මුදල් ගලා ඒම් හා මුදල් ගලායෑම් හඳුනා ගත්තද, ඒ තුළින් නිවැරදිව පිළිගෙවුම් කාලය සෙවීමට බොහෝ සිසුනට නොහැකිව තිබුණි.

(ආ) (3) කොටසෙහි පහසුතාව 8%කි. මුදල් ප්‍රවාහයන් ඇසුරෙන් එක් එක් වර්ෂවල ලාභය ගණනය කිරීමට අදාළ අවබෝධය බොහෝ සිසුනට නොතිබිණි.

ව්‍යාපෘතියකට අදාළව මුදල් ගලාඒම් හා ගලායෑම් හඳුනාගැනීම, ශුද්ධ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීම, ඒ ඇසුරෙන්,

* පිළිගෙවුම් කාලය ගණනය කිරීම
* මුදල් ප්‍රවාහ ඇසුරෙන් ලාභ ගණනය කිරීම
* වට්ටම් සාධකය මගින් වර්තමාන අගය ගණනය කිරීම
* වර්තමාන අගයන් තුළින් ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම
* ශුද්ධ වර්තමාන අගයට අනුව සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීම

පිළිබඳ ව අවබෝධය තහවුරු වනසේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වනු ඇත.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



II ප්‍රශ්න පත්‍රයේ 4 වන ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්නවල පහසුතාවය 43% හෝ ඊට වැඩිය.

II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අතරින් 64%ක වැඩිම පහසුතාවක් දැකිය හැක්කේ 3 වන ප්‍රශ්නයේ වන අතර 35%ක අඩුම පහසුතාවක් දැකිය හැක්කේ 4 වන ප්‍රශ්නයේය.

පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වේ. මෙම ප්‍රශ්න දෙක අතුරින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ 2 වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 59%කි.

3 වන ප්‍රශ්නයේ සිට 7 වන ප්‍රශ්නය තෙක් අයදුම්කරුවන්ට තෝරා ගැනීම සඳහා ලබාදී ඇති ප්‍රශ්න අතුරින් වැඩිම පහසුතාවක් දැකිය හැක්කේ 3 වන ප්‍රශ්නයේ වේ. එහි පහසුතාව 64%කි. ප්‍රශ්න තෝරා ගැනීමේදී 91%ක් වූ වැඩිම පිරිසක් තෝරාගෙන ඇත්තේ ද 3 වන ප්‍රශ්නය වේ. දෙවන ප්‍රශ්න පත්‍රයේ තෝරා ගැනීම සඳහා ලබා දී ඇති ප්‍රශ්නවලින් අඩුම පහසුතාව දැකිය හැක්කේ 4 වන ප්‍රශ්නයේ වන අතර එය 35%කි.

තෝරා ගැනීම සඳහා ලබාදී ඇති ප්‍රශ්න අතරින් දෙවනුව වැඩිම පිරිසක් එනම් 68%ක් තෝරා ගෙන ඇත්තේ 7 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 43%කි.

III කොටස

3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එනම් ප්‍රශ්න පත්‍රය කොටස් කීපයකින් යුක්ත වන්නේ නම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, ඒ සඳහා කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල්ව අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් ආසන්න පිළිතුරු අතුරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගත යුතු ය.
* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.
* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.
* ප්‍රශ්න අංක හා අනුකොටස් නිවැරදි ව ලිවිය යුතු ය.
* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය.
* ප්‍රශ්නයෙහි අසා ඇති ආකාරය අනුව තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.
* II වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේදී ප්‍රධාන ප්‍රශ්නය යටතේ ඇති අනුකොටස් සියල්ල හොඳින් කියවා බලා එක් එක් අනුකොටසට අදාළ ඉලක්ක ගත පිළිතුර පමණක් ලිවිය යුතු ය.
* ගැටලුවලට පිළිතුරු සැපයීමේ දී ලබාදී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය. මෙහිදී ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාල කළමනාකරණය කරගත යුතුය.
* පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.

විශේෂ උපදෙස් :

1. ප්‍රශ්නවලට අදාළ පිළිතුර පියවරෙන් පියවර ඉදිරිපත් කළ යුතුය.
2. ප්‍රශ්න විසඳීමේ දී දහස් සංඛ්‍යාවලින් ඉදිරිපත් කරන්නේ නම් සියලු සංඛ්‍යා දහස්වලින් බව දැක්විය යුතුය. (එනම් රු'000)
3. එක් එක් ප්‍රශ්නයට අදාළ පෙර වැඩ ඒ ඒ පිළිතුර සමග ඉදිරිපත් කළ යුතුය.
4. ප්‍රශ්නයක අනුකොටස් ඇති විටක දී පිළිතුරු නියමිත අනුකොටස් අංක සඳහන් කරමින් ඉදිරිපත් කළ යුතුය.
5. ප්‍රශ්නයක අනුකොටස් ඇතිවිටක එහි පිළිතුරු සෑම තැනකම විසුරුවා හැරීම නොකළ යුතුය.
6. ඉලක්කම් ලිවීමේදී පැහැදිලි ව ලිවිය යුතුය.
7. තමා ලද අගය භාවිත කරමින් සම්පූර්ණ පිළිතුර සැපයිය යුතුය.
8. විශේෂයෙන් ම සමාගම් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ගිණුම්කරණ සටහන් හා පෙර වැඩ අතර වෙනස වටහා ගෙන පිළිතුරු සැපයීම වගබලා ගත යුතුයි.

3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* විෂය නිර්දේශය, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත, 2007 අංක 07 දරන සමාගම් පනත, උසස් පෙළට නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිත, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පළකර ඇති
  (1) ගිණුම්කරණ ප්‍රමිත සහ සමාගම් ගිණුම්කරණය
  (2) පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණය
  පිළිබඳ ව ගුරුභවතුන් මෙන්ම සිසුන් ද දැනුවත් වීම හා භාවිතය අවශ්‍යය.

* ගිණුම්කරණ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ලබා දී ඇති ගැටළු විසඳීම සාර්ථකව සිදුකිරීමට නම් පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතුවලදී ව්‍යාපාර ලෝකයේ ප්‍රායෝගික ගැටළු මුල් කරගෙන අභ්‍යාස සකස් කර ලබාදීම අවශ්‍යය.

* සාක්ෂරතාවයේ අඩුපාඩු හේතුවෙන් ප්‍රශ්න අවබෝධ කරගැනීමේ ගැටළු සහ ප්‍රකාශන හැකියාවේ ගැටළු අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

* ප්‍රායෝගිකව ව්‍යාපාර ලෝකය භාවිත කරන මූලාශ්‍ර ලියවිලි හා ගිණුම් වාර්තා පන්ති කාමර ආධාරක ලෙස භාවිතා කරමින් විෂය සංවර්ධනය කිරීමට අවශ්‍ය අත්දැකීම් තහවුරු කිරීමට මග සැලැස්වීම අවශ්‍යය.
  නිදසුන් - මූලාශ්‍ර ලියවිලි
  - බැංකු ප්‍රකාශන
  - වැටුප් ලේඛන
  - තොග වාර්තා
  - වාර්ෂික වාර්තාව

* මෙම විෂය තමාට මෙන්ම සමාජයට ද එකසේ වැදගත් විෂයයක් වන බැවින් හැමවිටම ඉගෙනුම් ක්‍රියාවලිය අවබෝධයෙන්, තර්කානුකූලව මනසට රසවත් වන පරිදි විෂය ඒකක ඉගෙන ගත යුතු බවත්, එක් එක් ඒකකය ඉගෙන ගත යුත්තේ මන්ද යන්න දරුවාගේ මනසට අවධාරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමත් කළ යුතුය.

* මෙම විෂය තීරණ ගැනීම සඳහා වැදගත් වන විෂයයක් වන බැවින් විෂයයේ සෑම ඒකකයක් සඳහා ම ඉගෙනුම් උපකරණ හා මෙවලම් භාවිතා කිරීම තුළින් ප්‍රබෝධක ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීමට හා කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව ලබාදීම යෝග්‍යය.

* නව විෂය දැනුම සංවර්ධනය කර ගැනීම හා යාවත්කාලීන කරගැනීමට නිරන්තරයෙන් කටයුතු කරන ගුරුභවතුන් කුසලතා පූර්ණ නිර්මාණශීලී පුද්ගලයන් වන අතර ඔවුන් මතු පරපුරට ද මහඟු දායාදයන්ය.